2025 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂ අංකය : 233

නො. 31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල
www.analyst.gov.lk
govanalyst@sltnet.lk

එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය
ආණ්ඩුවේ රස පරීක්ෂක

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික තොරතුරු **4**

1.1 හැඳින්වීම
1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණ
1.3 ප්‍රධාන කාර්යයන්
1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ
1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති විස්තර

පරිච්ඡේදය 02 - දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය **12**

පරිච්ඡේදය 03 – 2024/12/31 දිනට සමස්ත මූල්‍ය කාර්ය සාධනය **24**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
3.4 මූල්‍ය ප්‍රකාශන වලට සටහන්
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය
3.7 මු.රෙ 208 අනුව ප්‍රතිපාදන පැවරීම
3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය
3.9 විගණකාධිපති වාර්තාව

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක **40**

පරිච්ඡේදය 05 - නිරසර සංවර්ධන ඉලක්ක **40**

පරිච්ඡේදය 06 - මානව සම්පත් කළමනාකරණය **41**

6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය
6.2 කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්ත
6.3 මානව සම්පත් කළමනාකරණය

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **53**

01 පරිච්ඡේදය

ආයතනික තොරතුරු

1.1 හැඳින්වීම

වර්ෂ 1904 සැප්තැම්බර් මාසයේ ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව එක් නිලධාරියෙකු සමඟ ආරම්භ කරනු ලැබූ ආණ්ඩුවේ රස පරීක්ෂක ආයතනයේ ප්‍රථම රස පරීක්ෂකවරයා ලෙස බ්‍රිතාන්‍ය ජාතික කේ. සී බ්‍රවුනින් මහතා ඉතිහාසයට එක්වේ.

ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව පැවති මෙම ආයතනය වර්ෂ 1913දී රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත විය. දෙපාර්තමේන්තුවක් ලෙස විකාශනය වෙමින් පැවැති මෙම ආයතනය, වර්ෂ 1934 දී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ පැවැති ගොඩනැගිල්ලක ප්‍රතිස්ථාපනය කරන ලදී.

ආරම්භයේ සිටම විදේශීය ප්‍රධානීන් යටතේ පැවැති මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික රස පරීක්ෂකවරයා ලෙස ඩබ්.ආර් චන්මුගම් මහතා 1945 දී පත්විය. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යයන් පුළුල් කරමින් 1935දී සැක කටයුතු ලේඛණ පරීක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර 1940දී ප්‍රථම සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ලෙස තම්බයියා නාගේන්ද්‍රන් මහතා පත්විය.

වර්ෂ 1960දී ආරක්ෂක අමාත්‍යාංශය යටතේත්, 1978 දී අධිකරණ අමාත්‍යාංශය යටතේත් ක්‍රියාත්මක වෙමින් පැවැති මෙහි ප්‍රථම කාන්තා රස පරීක්ෂකවරිය ලෙස 1993 දී යෝගරාණී මහේසන් මහත්මිය ඉතිහාසයට එක්විය.

විද්‍යාගාරයක් සඳහා උචිත නොවන ගොඩනැගිල්ලක ගැටළු රාශියකට මුහුණ දෙමින් වර්ෂ සියයකට අධික කාලයක් කොළඹ නිදහස් චතුරශ්‍රයේ පැරණි ගොඩනැගිල්ලක පැවැති රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, 2013 වර්ෂයේදී බත්තරමුල්ල, පැලවත්තේ ඉදි කරන ලද මහල් 06ක් සහිත නව විද්‍යාගාර හා කාර්යාල සංකීර්ණයකින් සමන්විත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදී.

නවීන අංගෝපාංග වලින් සමන්විත නව විද්‍යාගාරය ස්ථාපිත කිරීම හා සමගාමීව නව තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීමට හැකිවීම, අපරාධ යුක්තිය ඉටුකිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක විශ්ලේෂණ කාර්යක්ෂම ලෙස ඉටුකිරීමට මහඟු පිටිවහලක් විය.


එසේම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීමේදී අධිකරණ විද්‍යා අංශයට අත්‍යවශ්‍යව පැවැති DNA තාක්ෂණය මෙරටෙහි ස්ථාපිත කිරීමෙහිලා ශ්‍රී ලංකා රජය හා USAID ව්‍යාපෘතිය හා එක්ව DNA විද්‍යාගාරයක් 2013 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලෙහි ආරම්භ කරන ලදී.


කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (KOICA) මඟින් ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ DNA විද්‍යාගාරය වැඩි දියුණු කිරීමත්, ශ්‍රී ලංකාව තුල ප්‍රථම වරට පරිගණක අපරාධ විමර්ශණ විද්‍යාගාරයක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමත්, දෙපාර්තමේන්තුව මඟින් අපරාධ යුක්තිය පසිඳලීම සඳහා සපයන විද්‍යාත්මක සාක්ෂි, තවදුරටත් සඵලදායී කිරීම සඳහා ලැබුණු සුවිශේෂී පියවරකි.


මේ අයුරින් ලබාගන්නා ලද විද්‍යාත්මක විශ්ලේෂණ වල ඉහල ගුණාත්මකභාවය තුළින් 2016 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර සඳහා ISO 17025 අන්තර්ජාතික ප්‍රතීතකරණය ලබාගත හැකි විය. වර්ෂ 1904 දී එක් නිලධාරියෙකුගෙන් ආරම්භ කළ මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් නිලධාරීන් 83 ක් පමණ සේවය කරන අතර 23 වන රස පරීක්ෂකවරිය ලෙස එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මහත්මිය පත්වී ඇති අතර 8 වන සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ලෙස කේ.කේ. අප්සරා මෙනවිය පත්විය.

මෙම දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා යන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක යටතේ ක්‍රියාත්මක වන අතර නිහඬ වූත්, අභිමානවූත් සේවයක් ශ්‍රී ලංකාව තුළ සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩ නැංවීම වෙනුවෙන් ඉටුකරනු ලබයි.

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු







1.3 ප්‍රධාන කාර්යයන්

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවේ ඇති එකම රජයේ අධිකරණ විද්‍යා විද්‍යාගාරය වේ. ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍ය හා ගිණි විමර්ශන, මත්ද්‍රව්‍ය හා මනෝවර්තක, මස්තු විද්‍යා හා DNA, ධූලක විද්‍යා, සැකකටයුතු ලේඛන, පරිගණක ඩිජිටල් අපරාධ විමර්ශන සහ විවිධ නඩු භාණ්ඩ යනුවෙන් ප්‍රධාන අංශ අටකින් අධිකරණ විද්‍යා අංශය සමන්විත වේ. ආහාර අංශය අහාර, ජලය හා මත්පැන් යනුවෙන් රසායනාගාර තුනකින් සමන්විතය.

මෙම දෙපාර්තමේන්තුව සේවාවන් සඳහා වෙන්වූ ආයතනයක් වන අතර, අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය, වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මඟින් යොමු කරනු ලබන නඩු භාණ්ඩ හා වෙනත් ආදර්ශ හා සාම්පල් විද්‍යාත්මක පරීක්ෂණයන්ට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සිදුකරනු ලබයි. මීට අමතරව විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන ආහාර, මත්පැන්, කිරි හා ජලය ආශ්‍රිත ආදර්ශ වල තත්වය පරීක්ෂා කර වාර්තා ලබාදීම සිදු කරනු ලබයි. තවද අධිකරණ මඟින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛණ පරීක්ෂා කර වාර්තා කිරීම සැක කටයුතු ලේඛණ අංශය මඟින් සිදු කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි ආඥා පනත, ආහාර පනත, ජාතික පාරිසරික පනත, සුරාබදු ආඥා පනත, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පළිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිණිඅවි ආඥා පනත, පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත, විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ පනත, මෝටර් වාහන පනත, බුද්ධිමය දේපල පනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.


තවද දිවයිනේ සිදුවන මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, වෙඩි තැබීම් ආදී දරුණු ගණයේ අපරාධ සහ පිපිරීම්, ගිනි ගැනීම්, මාරක රිය අනතුරු සම්බන්ධ අපරාධ ස්ථාන විමර්ශණයන් සඳහා නිලධාරීන්ගේ විශේෂඥ සහාය පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදේ. මීට අමතරව දේශීය හා විදේශීය ප්‍රභූන් හා රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ආහාර පරීක්ෂාව සිදු කරනු ලබන්නේ ධූලක විද්‍යා (වස විෂ) අංශය මඟිනි.

රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද රස පරීක්ෂක වාර්තා සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් අධිකරණයේදී විශේෂඥ සාක්ෂිකරුවන් ලෙස දිවයිනේ විවිධ අධිකරණ වලදී විශේෂඥ සාක්ෂි ලබාදෙනු ලැබේ.

මෙවැනි සේවා සැපයීමට අමතරව විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විශේෂඥ නිලධාරීන් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදුකරයි. විශේෂයෙන්ම ආහාර පනත යටතේ පනවනු ලබන රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සෑදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලබාදෙනු ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ, පුපුරන ද්‍රව්‍ය හා වෙනත් රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම් වලදී මෙන්ම වෙනත් ආයතනවල අධි තාක්ෂණික උපකරණ මිලදී ගැනීම් වලදී තාක්ෂණික කමිටු වලට තාක්ෂණික සහාය ලබාදීමද මෙම නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.

තවද පොලිස් නිලධාරීන්, අපරාධ පරීක්ෂණ නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ ආධුනික නීතීඥයන්ට හා අධිකරණ වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ඔවුන්ගේ අධිකරණ විද්‍යාත්මක හා ආහාර විද්‍යාත්මක දැනුම ප්‍රවර්ධනය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් විසින් දේශන, පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

අධිකරණ විද්‍යා අංශය

මෙම අංශය යටතේ පහත සඳහන් විශ්ලේෂණ රසායනාගාර පවතී.

1. ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා රසායනාගාරය

ගිනිඅවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය විසින් විවිධ වර්ගයේ ගිනි අවි එනම් රයිපල, පිස්තෝල, පතරොම්, තුවක්කු, කොටන තුවක්කු සහ පතරොම් වර්ග ලහ තබා ගැනීමකදී, මෙවා අපරාධ සඳහා යොදා ගත් බවට සැක කරන අවස්ථා වලදී ඒවා පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලබයි. ගිනි අවි භාවිතා කොට සිදු කරනු ලබන අපරාධ පිළිබඳව අන්වීක්ෂීය සැසඳුම් පරීක්ෂණ සිදුකරමින් විද්‍යාත්මකව විමර්ශණය කිරීම මීට ඇතුළත් වේ. ඒ සඳහා අපරාධ වලදී භාවිතා කරන ලද ගිනිඅවි, ගිනි අවි වල කොටස්, විවිධ පතරොම් වර්ග, වැයවූ පතරොම් කොපු හා උණ්ඩ ආදිය පරීක්ෂා කරනු ලැබේ. තවද වෙඩි තැබීම් වලට ලක්වූ මෝටර් රථ, ගොඩනැගිලි ආදියද පරීක්ෂාවට ලක්කරන අතර කුමන ගිනි අවියක් අදාල අපරාධ සඳහා භාවිතා කළේද යන්න පිළිබඳ විශේෂඥ මතයන් ඉදිරිපත් කරනු ලැබේ.

2. පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි විමර්ශන රසායනාගාරය

මෙම අංශය මඟින් බෝම්බ පිපිරීම්, පුපුරණ ද්‍රව්‍ය හා පිපිරුම් උපක්‍රම (බෝම්බ) යමෙක් තම සන්තකයේ තබා ගැනීම් ඇතුළු පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර සිදුකරන අපරාධ වලට අදාල නඩු භාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. සන්තකයේ තබා ගැනීමේදී අත් අඩංගුවට ගන්නා ලද විවිධ වර්ගයේ පිපිරුම් උපක්‍රම (දේශීය හා විදේශීයව) නිෂ්ක්‍රීය කිරීමෙන් පසු, ඒවායේ කොටස්ද මෙම නිලධාරීන් විසින් විශ්ලේෂණයට භාජනය කරනු ලබයි. එමෙන්ම දේපළ, ගොඩනැගිලි හා වාහන ආදිය ගිනිගැනීම් වලදී පොලීසියට කරනු ලබන පැමිණිලි හා රක්ෂණ වන්දි සඳහා කරනු ලබන ඉල්ලීම අනුව එම ගිනි ගැනීම් පිළිබඳව විමර්ශණය කර ගිනි ගැනීමට හේතුව සම්බන්ධයෙන් මතයන් ඉදිරිපත් කිරීමද මෙම අංශයේ නිලධාරීන්ගේ කාර්යයට අදාල වේ.

3. මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක රසායනාගාරය

පොලීසිය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, සුරාබදු මත්ද්‍රව්‍ය අංශය හෝ ශ්‍රී ලංකා රේගුව මඟින් අත්අඩංගුවට ගනු ලබන අන්තරාදායක ඖෂධ හා මනෝවර්තක යටතට ගැනෙන හෙරොයින්, මෝර්ෆීන්, අබිං, ගංජා සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, කොකේන්, මෙත්ඇම්ෆිටමීන් සහ එම කාණ්ඩයට අයත් මත්ද්‍රව්‍ය සහ New Psychoactive Substances (NPS) ගණයට වැටෙන මත්ද්‍රව්‍ය රසායනිකව හඳුනාගැනීම හා ඒවාහි ක්‍රියාකාරී සංඝටක වල සංශුද්ධතාව විශ්ලේෂණය කර අධිකරණය වෙත වාර්තා කිරීම මෙම අංශය මඟින් සිදුකරනු ලබයි. එමෙන්ම අවශ්‍ය අවස්ථාවලදී මත්ද්‍රව්‍ය රඳවාගත් ස්ථාන, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලැබීයැයි සැකකරන ස්ථාන සහ මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදාගත් වාහන ආදිය පරීක්ෂා කිරීමට පොලීසියට අවශ්‍ය විශේෂඥ සහාය ලබාදේ.

4. අධිකරණ මස්තු විද්‍යා සහ ඩී.එන්.ඒ රසායනාගාරය

විවිධ දරුණු අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ලබා ගන්නා ජීව විද්‍යාත්මක ද්‍රව්‍යය මෙන්ම, ජීව විද්‍යාත්මක මව, පියා සහ දරුවන් යන මෙම පාර්ශව අතර සම්බන්ධතාවය තහවුරු කර ගැනීම සඳහා මිනිස් ශරීරයේ ශාරීරික ජෛව තරල හා දත් ඇතුළු ඕනෑම ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයක් අනුසාරයෙන් පරීක්ෂණ කටයුතු සිදු කර, ඩී.එන්.ඒ තාක්ෂණය ආශ්‍රයෙන් වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

එමෙන්ම සංකීර්ණ මිනීමැරුම් සහ අපරාධ ස්ථාන වල වූ රුධිර පැල්ලම්, කෙස්, ලේ විසිරීම් රටා ආදී ජීව විද්‍යාත්මක සාක්ෂි පරීක්ෂා කර, විශ්ලේෂණයෙන් අනතුරුව වාර්තා නිකුත් කිරීමද මෙම අංශයේ රාජකාරී වලට අයත් වේ.

5. අධිකරණ ධූලක විද්‍යා රසායනාගාරය

අධිකරණ ධූලක විද්‍යා අංශයේ සිටින විශේෂඥයන් විසින් අධිකරණ වෛද්‍ය කාර්යයන් හා අපරාධ විමර්ශණ සඳහා වස වර්ග හඳුනා ගැනීම පිණිස විශ්ලේෂණ කටයුතු රාශියක් සිදු කරනු ලැබේ. අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් හෝ අධිකරණය විසින් භාරදෙනු ලබන සැක සහිත සහ හදිසි මරණ වලට භාජනය වූ තැනැත්තන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණවලදී ලබාගත් ශරීර කොටස් හා ආදර්ශ, මත්ද්‍රව්‍ය සහ අනෙකුත් වස වර්ග වන සයනයිඩ්, පලිබෝධ නාශක වර්ග, විඛාදක අම්ල වර්ග සහ කාබන් මොනොක්සයිඩ් වැනි අහිතකර රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණය කිරීම, බීමත්ව රිය පැදවීම සැක කරන අවස්ථාවලදී සහ මාරක රිය අනතුරුවලදී මත්පැන් හෝ වෙනත් ඖෂධ භාවිතා කර තිබේදැයි හඳුනා ගැනීම සඳහා පුද්ගලයින්ගේ රුධිරය සහ මූත්‍රා සාම්පල විශ්ලේෂණය කිරීම, අපරාධ ස්ථානයෙන් සොයාගත් අධිකරණ විද්‍යාත්මකව වැදගත් භෞතික සාක්ෂි (ඖෂධ පෙති, වස බෝතල, ඉතිරි වූ ආහාර ද්‍රව්‍ය ආදිය) ද මත්ද්‍රව්‍ය, විෂ වර්ග සහ අම්ල වර්ග හඳුනා ගැනීම සඳහා රසායනික විශ්ලේෂණ මෙම අංශය මඟින් සිදුකෙරේ.

6. අධිකරණ විද්‍යාත්මක සැකකටයුතු ලේඛන විද්‍යාගාරය

අධිකරණමය හා නීතිමය කටයුතු සඳහා අවශ්‍ය වන සැක සහිත ලිපි ලේඛන සහ ඒවා නිපදවීමට භාවිතා කරන ලද ද්‍රව්‍ය මෙම අංශය මඟින් පරීක්ෂාවන්ට ලක්කෙරේ.

සියළු වර්ග වල සැක කටයුතු ලේඛන, අත්අකුරු සහ අත්සන් ආදිය, මෙම අංශයේදී ඒවායේ නිර්ව්‍යාජභාවය සඳහා පරීක්ෂා කරනු ලැබේ. තවද අපරාධවලට මෙන්ම සිවිල් නඩු වලට අදාල ලේඛණවල තිබෙන වෙනස් කිරීම්, මැකීම්, විකෘති කිරීම්, එකතු කිරීම් සහ ආදේශ කිරීම් ආදිය හඳුනාගැනීම, ගමන් බලපත්‍ර, වීසා, ලිවීමේ උපකරණ, තීන්ත, කඩදාසි සහ අලවන ද්‍රව්‍ය, පිළිස්සුනු සහ විකෘති කරන ලද ලේඛන, ව්‍යාජ මුදල් නෝට්ටු, ලොතරැයිපත්, ආදායම් මුද්දර, තැපැල් මුද්දර සහ රජයේ ආදායමට සම්බන්ධ වෙනත් යම් ලේඛන පරීක්ෂා කර ඒවායේ නිර්ව්‍යාජ බව හෝ අදාල වෙනත් නිගමනයන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ඉදිරිපත් කිරීම මෙම අංශයේ විශේෂඥ නිලධාරීන්ගේ කාර්යභාරය වේ.

7. පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය

මෑතකදී ස්ථාපිත කර ඇති ඩිජිටල් අපරාධ විශ්ලේෂණ අංශය මූලික ලෙස ඩිජිටල් දත්ත විශ්ලේෂණය, ඩිජිටල් ඡායාරූප විශ්ලේෂණය, කටහඬ හා ශබ්ද විශ්ලේෂණය හා ජීවමිතික ලක්ෂණ විශ්ලේෂණය යන මූලික අංශ 4ක් යටතේ විශ්ලේෂණ කටයුතු සිදුකරනු ලබයි.

පරිගණක, ජංගම දුරකථන, CCTV DVR යන්ත්‍ර ආදී ඩිජිටල් උපාංග තුළ අන්තර්ගත දත්ත විශ්ලේෂණය හා ඒවායේ මකා දමා ඇති දත්ත ප්‍රතිඋත්පාදනය, CCTV වීඩියෝ දත්ත විශ්ලේෂණය, ජීවමිතික ලක්ෂණ ඇසුරින් CCTV දර්ශණ වල හා ඩිජිටල් උපකරණ වල දර්ශනය වන පුද්ගලයින්ගේ මුහුණු හඳුනා ගැනීම, CCTV දර්ශන වල ඇතුළත් අපැහැදිලි වාහන ලියාපදිංචි අංක තහඩු හඳුනා ගැනීම, ඩිජිටල් ඡායාරූප හා වීඩියෝ පට වැඩි දියුණු කිරීම විශ්ලේෂණය හා වෙනස් කිරීම් වලට ලක්කර ඇතිද යන්න හඳුනා ගැනීම සහ කටහඬ විශ්ලේෂණය මඟින් පටිගත කරන ලද සංවාදයන්හි මිනිස් කටහඬෙහි අනන්‍යතාවය තහවුරු කිරීම ආදී විශ්ලේෂණ මෙහිදී සිදු කරයි.

8. විවිධ නඩු භාණ්ඩ විශ්ලේෂණ විද්‍යාගාරය

විවිධ නඩු භාණ්ඩ අංශයේ සිටින අධිකරණ විද්‍යා විශේෂඥයින් විසින් අනිකුත් විෂයයන් යටතේ නිශ්චිතව වර්ගීකරණය කිරීමට නොහැකි අන්‍යාකාර වූ භෞතික සාක්ෂි පරීක්ෂාවට භාජන කරනු ලැබේ. සැක කටයුතු වාහන වල චැසි අංක සහ එන්ජින් අංක පරීක්ෂා කිරීම සහ ඒවා සත්‍යද, වංචනිකද, යන්න නිගමනය කිරීම හා බද්ධ කරන ලද වාහන හඳුනා ගැනීම එක් උදාහරණකි. තවද අපරාධ වලට සම්බන්ධ විවිධ වර්ගයේ ස්පර්ශ සාක්ෂි හා භෞතික සාක්ෂි උදාහරණ වීදුරු කැබලි, තීන්ත පතුරු, කෙදි වර්ග, පස්, ආයුධ, ආයුධ සලකුණු (ඇගිලි සලකුණු හැර), ලාංඡන ආදිය සඳහා විද්‍යාත්මක පරීක්ෂණ හා විවිධ තාක්ෂණික උපකරණ භාවිතා කරමින් කරනු ලබන පරීක්ෂණ මෙන්ම රසායනික විශ්ලේෂණ ක්‍රම මඟින් හඳුනා ගැනීම සහ සංසන්දනය මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ. මීට අමතරව වාහන අනතුරු වලට අදාල වන වාහන අනතුරු වූ ස්ථාන සහ අදාල අනෙකුත් සාක්ෂි විද්‍යාත්මකව පරීක්ෂා කර එම අනතුරු ප්‍රති නිර්මාණය කර අවශ්‍ය වැදගත් සාක්ෂි සොයා ගැනීම මෙම අංශයේ විශේෂඥයින්ගේ වගකීමකි.

1. ආහාර හා ජලය විශ්ලේෂණ රසායනාගාරය

1980 අංක 26 දරන ආහාර පනත යටතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ආහාර පරීක්ෂකවරුන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්) විසින් ඉදිරිපත් කරනු ලබන ආහාර සාම්පල, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන, විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ආහාර පාලන ඒකකය, අනෙකුත් රජයේ ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන එවැනි ආහාර සාම්පල විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම හා රේගු දෙපාර්තමේන්තුව, පාරිභෝගික කටයුතු අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආදී ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන සාම්පල විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ජාතික පාරිසරික පනත යටතේ ආණ්ඩුවේ විවිධ ආයතන සහ සංස්ථා සඳහා කර්මාන්ත අප ජලය විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම අහාර පනත යටතේ බෝතල් කරන ලද ජලය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති රෙගුලාසි යටතේ පානීය ජලය සඳහා විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

2. මද්‍යසාර විශ්ලේෂණ රසායනාගාරය

අධිකරණය මඟින් විශ්ලේෂණය සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන නීති විරෝධී මත්පැන් සහ දුම්කොළ නිෂ්පාදන විශ්ලේෂණය කර සුරා බදු ආඥා පනත යටතේ අධිකරණය වෙත වාර්තා නිකුත් කිරීම සහ සුරාබදු දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලබන දේශීය සහ විදේශීය මත්පැන් සඳහා තත්ත්ව වාර්තා නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

ගිණුම් අංශය

දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය වන කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියට දායක වීම සඳහා අවශ්‍ය සම්පත් සහ යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය වන අරමුදල් රැස්කිරීම සහ ඒවා කාර්යක්ෂමව, ඵලදායී සහ ආර්ථිකමය වශයෙන් මෙහෙයවීම තුළින් මූල්‍ය කළමනාකරණය කිරීම හා ඊට සම්බන්ධ ගිණුම් කටයුතු පවත්වාගෙන යාමද, මූල්‍ය තොරතුරු අවශ්‍ය වෙනත් පාර්ශවයන් වෙත ලබාදීමද මූල්‍ය අංශයේ වගකීම වේ.

එම කටයුතු කර ගෙන යාමේදී,

- කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය උපදෙස් හා මග පෙන්වීම
- ආයතනය සතු වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීම
- රාජ්‍ය මුදල් රෙගුලාසි හා චක්‍ර ලේඛ විධි විධාන වලට අනුකූලව මූල්‍ය පරිහරණය කිරීම
- ගිණුම්කරණය හා වාර්තා කිරීම යනාදී කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

ආයතන අංශය

දෙපාර්තමේන්තුව තුල ප්‍රශස්ත කාර්යමණ්ඩලයක් පවත්වා ගනිමින් හා විධිමත් මානව සම්පත් කළමනාකරණය තුලින් කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම සහ සම්බන්ධීකරණය මෙම අංශය මගින් සිදුකරනු ලැබේ. ඒ යටතේ,

- කාර්යමණ්ඩල බඳවා ගැනීම්, පුහුණු කිරීම , ධාරිතා සංවර්ධනය, උසස් කිරීම හා විශ්‍රාම ගැන්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය තුල ඇති දීපව්‍යාප්ත සේවාවන්වල හා ඒකාබද්ධ සේවාවන්වල නිලධාරීන්ගේ පරිපාලන කටයුතු රේඛීය අමාත්‍යාංශය වන අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන පලාත් සභා හා පලාත්පාලන කටයුතු අමාත්‍යාංශය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග සම්බන්ධවෙමින් සිදු කිරීම.
- දෙපාර්තමේන්තුවේ අංශ අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීමටත් එම අංශවල කටයුතු ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් හා වෙනත් සම්පත් සම්පාදනය කිරීම.
- ආයතනයේ සියළු නඩත්තු කටයුතු අදාල පරිදි ගිවිසුම් ගත වෙමින් ඉටුකිරීම.
- ආයතනයේ දෛනික ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම.

1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතියේ විස්තර

ව්‍යාපෘතියේ නම	ප්‍රදානය කරන රට	ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල	ව්‍යාපෘතියේ කාලය
ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ අධිකරණ විද්‍යා ඖෂධ විශ්ලේෂණයේ ධාරිතා ගොඩ නැගීම ශක්තිමත් කිරීම.	කොරියාව (KOICA Project)	ඇ. ඩො. මි. 4.5	2022-2025

02 පරිච්ඡේදය

කාර්ය සාධනය සහ අනාගත අභියෝග

විශ්ලේෂණ වාර්තා වල ප්‍රගතිය

වර්ෂයක් තුළ නිකුත් කරනු ලබන විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධනය මැන බැලීමේ ප්‍රධාන දර්ශකය වේ. 2024 වර්ෂයේ ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව 64,524 ක් වන අතර 2025 වර්ෂයේදී ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව 70,846 ක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව එය 10% දක්වා වර්ධනයකි. තවද 2025 වර්ෂය තුළ නිකුත් කළ විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව 57,410ක් වූ අතර 2024 වසරේ නිකුත් කළ විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව 52,126කි. එය 2024 වර්ෂයට සාපේක්ෂව 10%ක වැඩි වීමකි.

	2024	2025
ලැබුණු නඩු භාණ්ඩ සංඛ්‍යාව	64,524	70,846
වාර්තා කල නඩු භාණ්ඩ සංඛ්‍යාව	52,126	57,410

ඒ ඒ අංශවල කාර්යසාධනය :-


අංශය	අංශය	**2025.01.01** දිනට නඩු සංඛ්‍යාව	ලැබුණු නඩු සංඛ්‍යාව	වාර්තා කල නඩු සංඛ්‍යාව	**2025.12.31** දිනට වාර්තා නොකල නඩු සංඛ්‍යාව
අධිකරණ විද්‍යා ක්ෂේත්‍රය	මත්ද්‍රව්‍ය හා මනෝවර්තක	17,671	41,704	30,089	29,286
	ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා	571	631	557	645
	පුපුරණ ද්‍රව්‍ය හා ගිනි ගැනීම්	352	623	550	425
	අධිකරණ ධූලක විද්‍යා (වස වර්ග)	2,223	3,392	2,832	2,783
	අධිකරණ මස්තු විද්‍යා	4,000	2,464	1,809	4,655
	සැක කටයුතු ලේඛණ	258	840	779	319
	ඩිජිටල් අපරාධ	1,467	1,169	573	2,063
	විවිධ අධිකරණ ද්‍රව්‍ය	421	1,190	949	662
එකතුව		**26,963**	**52,013**	**38,138**	**40,838**
ආහාර විද්‍යා ක්ෂේත්‍රය	මත්පැන්	3,228	11,559	12,015	2,772
	මධ්‍යසාර හා දුම්කොළ	-	2,997	2,995	2
	ආහාර පනත යටතේ ආහාර සාම්පල	22	3,519	3,503	38
	විවිධ ආහාර වර්ග	7	758	759	6
එකතුව		**3,257**	**18,833**	**19,272**	**2,818**
මුළු එකතුව		**30,220**	**70,846**	**57,410**	**43,656**


සමස්තයක් ලෙස ගත් කල වැඩිම නඩු සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශයට වන අතර ඊට අනුව වැඩිම වාර්තා ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ ද එම අංශයෙනි.


විශ්ලේෂණ කටයුතු වලට අමතරව සිදුකරනු ලැබූ කාර්යයන්


කාර්යය	සංඛ්‍යාව
අධිකරණ වලදී සාක්ෂි සැපයූ අවස්ථා	දින 318
අපරාධ ස්ථාන වලට සහභාගී වූ අවස්ථා	දින 469
නිවාඩු දින දීමනා හා අතිකාල දීමනා	දින 830 සහ පැය 593.3
ධූලක විද්‍යා අංශයේ නිලධාරීන් සහභාගී වූ විශේෂ ප්‍රහූ සහ රාජ්‍ය තාන්ත්‍රික ආහාර පරීක්ෂණ	නිලධාරි දින 13
දේශන පැවැත්වීම	දින 34
තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා සහභාගී වීම	දින 76

දේශීය පුහුණු	නිලධාරි දින 415
විදේශීය පුහුණු	නිලධාරි දින 114
පශ්චාත් උපාධිය සඳහා විදේශ ගත නිලධාරීන් (එක්සත් රාජධානිය)	01









1. විශ්ලේෂණය අවසන් කර ගත නොහැකි වූ නඩු භාණ්ඩ ප්‍රමාණය අඩු කිරීම

වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන නඩු භාණ්ඩ පිළිබඳ වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පුරප්පාඩු පිරවීම අත්‍යාවශ්‍ය වේ. 2025.12.31 වන විට සහකාර රස පරීක්ෂක නිලධාරීන් 38 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී ඇති අතර බඳවා ගැනීමට ඉල්ලුම් කර ඇත. තවද දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරු කිහිපයකට අදාලව 114ක් වූ කාර්යමණ්ඩලයක් පුරප්පාඩු වී ඇති අතර එය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සඳහා සෘජුවම බලපාන බව පෙන්වා දෙමි. තවද නඩු භාණ්ඩ ලැබීම 2025 වර්ෂය තුළදී 2024

වර්ෂයට සාපේක්ෂව 10% ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇති අතර පවතින අධික පුරප්පාඩු තත්වය තුළදී වුවද විශ්ලේෂණය අවසන් කර නඩු වාර්තා ඉදිරිපත් කිරීම 2024 වර්ෂයට සාපේක්ෂව 10% ක ප්‍රමාණයකින් පමණ ඉහළ ගොස් ඇත.

දෛනිකව ඉදිරිපත් වන නඩු භාණ්ඩ මෙන්ම ඉහත පරිදි විශ්ලේෂණය අවසන් කිරීමට නොහැකි වූ නඩු සම්බන්ධ කටයුතු නිම කිරීම සඳහා නිලධාරීන් නිවාඩු දින සේවයේ යෙදවීම අවශ්‍ය වන අතර සතියේ දිනවල අතිරේක පැය කිහිපයක් සේවය කිරීම මෙන්ම රජයේ නිවාඩු දින වල සේවයේ යෙදවීමටද සිදුවිය.

2. පර්යේෂණ හා සංවර්ධන අංශයක් ස්ථාපිත කිරීම

නවීනතම විද්‍යාත්මක ක්‍රමවේදයන් පිළිබඳ දැනුම දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ඉතා වැදගත් වේ. නව මත්ද්‍රව්‍යයන් හා රසායනිකයන් භාවිතයට එකතුවීම දිනපතා සිදුවන අතර දෙපාර්තමේන්තු නිලධාරීන් මෙම තත්ත්වයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් සහිත වීම අවශ්‍ය වේ. මේ සඳහා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට දේශීය මෙන්ම විදේශීය පුහුණු හා පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා ලබාදීම සිදුකල යුතුය.

3. අධිකරණ වලින් ඉදිරිපත් කරන ලද සාම්පල ඉවත් කිරීම

රටේ ක්‍රියාත්මක වන අධිකරණ ක්‍රමය තුළදී යම් නඩුවක් සඳහා අවසන් තීරණයක් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් පරීක්ෂණ අවසන් කරන ලද නඩු භාණ්ඩ ඉවත් කර ගැනීම ප්‍රමාද වේ. නඩු භාණ්ඩ ලැබීම අධිකවීම නිසා ඒවා ගබඩා කර තැබීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිකම දැඩි ගැටළුවකි. මේ හේතුවෙන් වාර්තා ඉදිරිපත් කල නඩු භාණ්ඩ දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් කාලානුරූපීව ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කල යුතුව ඇත. මේ සම්බන්ධයෙන් පොලිස්පතිතුමා සමග සාකච්ඡාවක් පවත්වා නඩු භාණ්ඩ ඉවත්කිරීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලීමක් කර ඇත. මේ වන විට පොලිස් නිලධාරීන් අධිකරණ නියෝගයන් අනුව නඩුභාණ්ඩ ඉවත් කිරීම සිදුකරනු ලබයි. 2025 වර්ෂයේ දී පමණක් මත්ද්‍රව්‍ය හා මනෝවර්ථක අංශයට අයත් නඩු භාණ්ඩ 21,524 ප්‍රමාණයක් ඉවත් කර ගෙන ඇත.

විශ්ලේෂණය අවසන් වූ නඩු භාණ්ඩ සම්බන්ධ ලේඛණ විශාල ප්‍රමාණයක් එක්රැස් වී පවතින අතර එම ලේඛණ ගබඩා කිරීම සඳහා මේ වන විට පවතින ඉඩ ප්‍රමාණවත් නොවේ. අධිකරණවල නඩු කටයුතු අවසන් වූ නඩු පිළිබඳ තොරතුරු රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා ගත හැකිනම් එක් රැස් වී ඇති අනවශ්‍ය ලේඛණ විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවෙන් ඉවත් කර නව ලේඛණ ගබඩා කිරීමට ඉඩ පහසුකම් යොදාගත හැක.

4. වීඩියෝ තාක්ෂණ ඔස්සේ විශේෂඥ සාක්ෂි ලබාදීම.

දිවයින පුරා පිහිටා ඇති අධිකරණ වල සාක්ෂි ලබාදීම සඳහා නිලධාරීන් සහභාගී කරවීමේදී මතුවන ගැටළු අවම කර ගැනීම සඳහා මාර්ගගත වීඩියෝ තාක්ෂණය මගින් කඩිනමින් සාක්ෂි ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම ඉතාමත් වැදගත් වේ. මෙහි මූලික පියවරක් ලෙස වීඩියෝ තාක්ෂණ උපකරණ කට්ටල දෙකක් අධිකරණ අමාත්‍යාංශය හා UNDP ව්‍යාපෘතිය මඟින් අප දෙපාර්තමේන්තුවට ලබාදුන් අතර ඒවා දැනටමත් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇත.





මෙම ක්‍රමය යටතේ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට රට පුරා පැතුරුණු විවිධ අධිකරණ වලට තම විශේෂඥ සාක්ෂි ලබාදීම කළ හැකිනම් භෞතිකව සහභාගීවීමට ගත වන කාලය විශාල වශයෙන් ඉතිරි වන නිසා කාලය වඩාත් ඵලදායීව රාජකාරී කටයුතු සඳහා යෙදවීමට හැකිවීම මෙන්ම රජයේ වියදම්ද සාපේක්ෂව අවම කර ගත හැකි බව පෙනේ.

5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

දිනෙන් දින වර්ධනය වන නඩු භාණ්ඩ ලැබීම කළමනාකරණය කර ගත හැකි පරිදි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ඵලදායීතාවය වර්ධනය කිරීම කෙරෙහි බලපානු ලබයි. ICTA ආයතනය මඟින් අදියර දෙකකින් යුත් ව්‍යාපෘතියක් ලෙස මෙම මෙහෙයුම් මෘදුකාංගයන් ලබාදීමට බලාපොරොත්තු වන අතර 2024 වර්ෂය තුලදී මෙම ව්‍යාපෘතිය නියමු මට්ටමින් ආරම්භ කරන ලදි.

6. පරීක්ෂණාගාර වල විශ්ලේෂණ කටයුතු කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීම

ඉදිරිපත් වන සාම්පල හා රසායනාගාර වල තොරතුරු ඵලදායීව හැසිරවිය හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම මේ යටතේ අපේක්ෂා කෙරේ.

7. යටිතල පහසුකම් සංවර්ධනය

2025 වර්ෂයේදී දේශීය අරමුදල්වලින් සැකටයටුතු ලේඛණ විද්‍යාගාරයට Document Workstation, Analytical Balance, Forensic Document Examination Workstation, Digital Caliper (Micrometer), Anti Vibration Table යන උපකරණ ද මත්ද්‍රව්‍ය අංශයට Gas Chromatography with FID detector, Analytical Balance, Anti vibration table යන උපකරණ ද පුපුරන හා ගිනි විමර්ශන විද්‍යාගාරයට Multi Gas Detector, Digital Heating Oven යන උපකරණ ද ආහාර විශ්ලේෂණ විද්‍යාගරයට UV visible Spectrometer, Inductivity Coupled Plasma Mas Spetrometer (ICPMS) යන උපකරණ ද ගිණිඅවි හා ප්‍රක්ෂේප්ත විද්‍යාගාරයට Bullet Hole Kit, Bullet Remover, Forensic Laser Trajectory Kit, Forensic Digital Distance Meter යන උපකරණ ද අධිකරණ මස්තු වද්‍යා හා ඩී.එන්.ඒ. රසායනාගාරයට Light Source Kit, Eppendorf ThermoMixer, Automatic Defrost Reregirator යන උපකරණ ද විවිධ නඩු භාණ්ඩ විශ්ලේෂණ රසායනාගාරයට Top Loading Balance, Trinocular Fluorescence Microscope යන උපකරණ ද ප්‍රසම්පාදනය කරන ලදි. එම ප්‍රසම්පාදනවලට අදාලව ගත් උපකරණවල ඡායාරූප පහතින් දක්වා ඇත.



1. Digital Heating Oven



Multi Gas Detector



Gas chromatography with FID detector



Automatic Defrost Refregirator



UV Visible Spectrometer






Inductively Coupled Plasma Mass Spectrometry (ICP-MS)



Fluorescence Microscope




Top Loading Balance



Analytical Balance



Digital Caliper (Micrometer)




Forensic Document Examination Workstation



Bullet Hole Kit



Forensic Digital Distance Meter



Bullet Remover



Forensic Laser Trajectory Kit

2025 වර්ෂයේ දෙපාර්තමේන්තුවට විශ්ලේෂණය සඳහා ලැබුණු නඩු භාණ්ඩ අතුරින් සුවිශේෂ සිද්ධීන්.

අධිකරණ මස්තු විද්‍යා හා ඩී.එන්. ඒ. අංශය.

1. මහේස්ත්‍රාත් අධිකරණය - කොළඹ - ප්‍රධාන

'ගනේමුල්ල සංජීව' නම් සංවිධානාත්මක අපරාධ සම්බන්ධව කටයුතු කරනු ලැබූ පුද්ගලයා අත්අඩංගුවෙහි සිට අළුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත නඩු කටයුතු සඳහා යොමු කර තිබියදී අධිකරණ පරිශ්‍රය තුල වෙඩි තබා ඝාතනය කිරීමට අදාලව ඉදිරිපත් කර තිබූ සාම්පලයන්හි (මියගිය පුද්ගලයාගේ සහ සැකකරුවන්ගේ) ඩී.එන්.ඒ. විශ්ලේෂණය සිදු කර අදාල වාර්තාව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කිරීම.

2. මහේස්ත්‍රාත් අධිකරණය - කුරුණෑගල

කුරුණෑගල Laugh's Gas ආයතනයේ සිදු වූ පිපිරීමක් හේතුවෙන් පුද්ගලයන් හතර දෙනෙකු මරණයට පත් ව ඔවුන්ගේ අනන්‍යතාවය තහවුර කිරීමට නොහැකි ආකාරයෙන් එම මෘත ශරීර විකෘති වී තිබිණ. අදාල ස්ථානයෙහි තිබූ එම පුද්ගලයන්ගේ බවට සැකකරනු ලැබූ පටක කොටස් සාම්පල 15ක් අදාල මවුවරුන්ගේ ආදර්ශ සාම්පල ද සමඟ ඩී.එන්.ඒ. මස්තු විද්‍යා අංශය වෙත ඉදිරිපත් කරන ලදී.

එම පටක සාම්පලයන්හි ඩී.එන්.ඒ. විශ්ලේෂණයන් ලබා ගන්නා ලද ඩී.එන්.ඒ. ඇලීල අංක රටාවන් අදාල මව්වරුන්ගේ සාම්පලයන්හි ඩී.එන්.ඒ. ඇලීල අංක රටාවන් සමඟ සංසන්දනාත්මකව පරීක්ෂා කිරීමෙන් අනතුරුව මියගිය පුද්ගලයින්ගේ අනන්‍යතාවය තහවුරු කරමින් ඔවුන් හඳුනා ගන්නා ලදී.

<u>පුපුරන ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය</u>.

1. රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි පිහිටි ගුවන්තොටුපල හා ගුවන් සේවා ශ්‍රී ලංකා පුද්ගලික සමාගමට අයත් පරිපාලන ගොඩනැගිල්ලේ 2025.04.06 දින සිදු වූ ගිනි ගැනීමක් හේතුවෙන් ඊට අලාභ හානි සිදු වීම පිළිබඳව විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

2. වැලිසර ලය රෝහලේ කසල බැහැර කිරීමේ අංගනය 2025.04.05 දින සිදු වූ ගින්නක් හේතුවෙන් අලාභ හානි සිදු වීම පිළිබඳව විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

3. වැලිගම වෝග් ටෙක්ස් ආයතනයේ අධි තාක්ෂණික අංශ ගොඩනැගිල්ලේ 2025.05.23 දින ඇති වූ ගින්නෙන් අලාභ හානි සිදු වීම පිළිබඳව විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

4. බොරැල්ලේ පිහිටි තැප්‍රොබේන් උත්සව ශාලාව 2025.04.06 දින ගින්නෙන් හානි වීම පිළිබඳ විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

5. කිරිඳිවැල නිවසක 2025.05.31 දින වයස අවු: 84 ක් වූ ගෙහිමි කාන්තාව පිලිස්සී මිය යාමට අදාළ විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

6. සපුගස්කන්ද තෙල් පිරිපහදු සංස්ථාවේ බොර තෙල් ගබඩා කරනු ලබන ටැංකියක් තුළ 2025.09.10 දින හදිසියේ ඇති වූ ගිනි ගැනීමට ඇති වූ විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

7. බලංගොඩ නිවසක් තුල 2025.08.09 වන දින ඇති වූ ගින්නක් හේතුවෙන් අවු: 08 ක් වයස ඇති දරුවෙකු මිය යාමට අදාල විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

8. බොරලැස්ගමුව, දිවුල්පිටියේ පිහිටි Klestro Manufactory Company හි 2025.02.08 දින ඇති වූ ගින්න හේතුවෙන් එම ගබඩාව හානි වීම පිළිබඳව විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

9. කන්කසන්තුරය උත්තර නාවික හමුදා කඳවුරේ රණ විජය හා එල් 821 කොහුකාවල අබලි ද්‍රව්‍ය ගබඩා කර තිබූ ගොඩනැගිල්ලේ 2025.07.25 දින ඇති වූ ගින්න පිළිබඳ විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

10. එළුවන්කුලම ගනේවාඩිය නිසසල නිම්න නිලධරු නිවස්නයේ අංක 10 කාමරයේ 2025.05.27 දින ඇති වූ ගින්න පිළිබඳ විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

11. මස්කෙලිය ලක්ෂපාන තේ කර්මාන්ත ශාලාවේ 2025.10.09 දින ඇති වූ ගින්න පිළිබඳ විමර්ශනය සිදුකර වාර්තාව නිකුත් කර ඇත.

12. යටියන්තොට, කිරිපෝරුව වතු යාය රබර් කර්මාන්තශාලාවේ රබර් කිරි වෙන් කිරීමේ යන්ත්‍රයක (Centrifuge machine) ඇති වූ පිපිරීම 2025.11.03 වන දින විමර්ශනය සිදුකර වාර්තාව සකස් වෙමින් පවති.

<u>සැකකටයුතු ලේඛන අංශය.</u>

1. රාජ්‍ය මුදල් අවභාවිතය සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂම මඟින් සිදුකරනු ලබන ආන්දෝලනාත්මක විමර්ශන සඳහා අවශ්‍ය අත්සන් හා අත්අකුරු පරීක්ෂණ සිදු කිරීම.

2. මහ නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ මුදල් වංචා කිරීම සම්බන්ධ පරීක්ෂණයේ අත්සන් හා මුද්‍රා සටහන් සම්බන්ධ පරීක්ෂණ සිදු කිරීම.

3. ඩුබායිහි සැහව සිටිව මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය වන පුද්ගලයන් හඳුනාගැනීම සඳහා වන පරීක්ෂණ සිදු කිරීම.

4. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ වාහනයක් සම්බන්ධ ආන්දෝලනාත්මක පරීක්ෂණයේ අත්සන් සම්බන්ධ පරීක්ෂණ සිදු කිරීම.

5. රජයේ ඉඩම් ව්‍යාජ ලේඛන සකස්කර පවරාගැනීම සම්බන්ධව ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා අධිකරණ මඟින් ඉදිරිපත් කරනු ලැබූ ලේඛන වල කාල නිර්ණය හා අත්සන් පරීක්ෂණ සිදු කිරීම.

6. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඖෂධ මිලදී ගැනීමේදී සිදුකරන ලද වංචාවට අදාල ලේඛන පරීක්ෂාව

ඩිජිටල් අපරාධ විශ්ලේෂණ

1. අතුරුගිරියේ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු ඝාතනයට අදාල පුද්ගලයන් හඳුනාගැනීම.

2. ජාතික ලොතරැයි මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂවරයෙකුට වෙඩි තැබීමට අදාල සිද්ධිය විශ්ලේෂණය කිරීම - තුසිත හල්ලොලුව.

3. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඖෂධ මිලදී ගැනීමේදී සිදුකරන ලද වංචාවට අදාල වීඩියෝ දර්ශන විශ්ලේෂණය

4. පොලිසියේ ප්‍රධානියෙකු හා කුඩු ජාවාරම් කරුවෙකු අතර සිදුවූ ගනුදෙනුවකට අදාල කටහඬ විශ්ලේෂණය

5. හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයෙකු සම්බන්ධ ඖෂධ මිලදී ගැනීමේදී සිදු කරන ලද වංචාවක් සම්බන්ධයෙන් වෛද්‍ය සැපයුම් අංශයේ දත්ත පද්ධතිය පරීක්ෂා කිරීම.

6. හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයෙකුගේ පවුලේ සාමාජිකයන් සිදු කරන ලද මූල්‍ය වංචා සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පරිගණක හා ජංගම දුරකථන පරීක්ෂා කිරීම.

7. හිටපු සෞඛ්‍ය අමාත්‍ය වරයෙකුගේ දියනියකගේ මූල්‍ය වංචා සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා හිටපු සෞඛ්‍ය ලේකම්වරයකුගේ දුරකථනයේ දත්ත පරීක්ෂා කිරීම.

8. ප්‍රබල පාතාල සාමාජිකයන්ට රටින් පිටවීම සඳහා ව්‍යාජ ගුවන් ගමන් බලපත්‍ර සකස් කර දීම. සම්බන්ධයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ ජංගම දුරකථන පරීක්ෂා කිරීම.

9. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේදී පුද්ගලයකු වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් සිදු කරන පරීක්ෂණ වලට සහය වීම පිණිස අදාල පරිශ්‍රයේ CCTV දත්ත පිටපත් කර ලබා දීම.

<u>මත්ද්‍රව්‍ය අංශය</u>

2025 වර්ෂයේදී, මත්ද්‍රව්‍ය අංශයට විශ්ලේෂණය සඳහා නඩු භාණ්ඩ සාම්පල 42,217 ක් ලැබී තිබුණි. මේ අතුරින් බර කිලෝග්‍රෑම් 100 නඩු භාණ්ඩ 13ක් ලැබී ඇත .

- විශේෂ අවස්ථාවක් ලෙස මෙත්ඇම්පිටමින් හෙවත් අයිස් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය අඩංගු ස්ථානයක් හමුවී ඇති බව බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාශයට තොරතුරු ලැබී ,එම ස්ථානය ,ස්ථානීය පරීක්ෂාවක් සිදුකර සාම්පල ලබාගෙන රසායනාගාර පරීක්ෂාවක් සිදු කරන ලදී .රසායනාගාර පරීක්ෂාවෙන් අහඹු ලෙස ලබාගත් සාම්පලවල මෙතැඇම්පිටමින් නැමැති විෂ මත්ද්‍රව්‍ය හඳුනා ගන්නා ලදී.

- තවත් වියශේෂ විශ්ලේෂණයක් යලස 2025 සැප්තැම්බර් මාසයේ වැලිගම නිවසක් සැකපිට නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධව මාතර පොලිසිය මගින් අනාවරණය වූ අතර ඒ සම්බන්ධව ස්ථානයේ පරීක්ෂාවක් සිදුකර සාම්පල ලබාගෙන රසායනාගාර පරීක්ෂාවක් සිදු කරන ලදී. එම ලබාගත් සාම්පලවල මෙෆඩ්‍රෝන් (මෙතිල් මෙතකැතිනෝන්) බවට නිගමනය කරන ලදී.

මෙලෙස ශ්‍රී ලංකාවේ රසායනාගාරයක මෙෆඩ්‍රෝන් නිෂ්පාදනය කරන බවට හමුවූ පළමු අවස්ථාව ලෙස සඳහන් කළ හැකිය.

මත්පැන් අංශය.

අතුරුගිරිය පොලීසියේ දූෂණ මර්ධන අංශය මගින් සිදුකරන ලද වැටලීමකින් හෝකන්දර පිහිටි හිටපු පොලිස්පතිට අයත් නිවසේ තිබී අත්අඩංගුවට ගන්නා ලද දේශීය හා විදේශීය නිෂ්පාදිත මත්පැන් හා වයින් වර්ග අඩංගු බෝතල් 1019ක නඩු භාණ්ඩ ප්‍රමාණයක් (සියළු නඩු භාණ්ඩ එක් නඩුවක් සඳහා අයත් වේ.) විශ්ලේෂණය සිදුකර වාර්තාව කඩිනමින් නිකුත් කිරීම.

ආහාර හා ජල විද්‍යාගාරය

1. වියලි මිරිස් වල පළිබෝධනාශක අඩංගු වන්නේදැයි පරීක්ෂා කිරීම සඳහා සියළුම පළාත් ආවරණය වන පරිදි සාම්පල 40 ක් පරීක්ෂාවට ලක් කරන ලදී.

2. රට තුල ඇති වූ ලුනු හිඟය මත ලුනු ආනයනය කල අවස්ථාවේ ඒවායේ ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ලුනු සාම්පල 100 පමණ පරීක්ෂාවට ලක් කරන ලදී.

අධිකරණ විවිධ නඩු භාණ්ඩ විශ්ලේෂණ අංශය

2025 වර්ෂයේදී සීඑම් අංශය මගින් විද්‍යාත්මකව විශ්ලේෂණය කරනු ලැබූ නඩු භාණ්ඩ හා ස්ථානීය පරීක්ෂා අතුරින් මහජනතාව අතර පහත සඳහන් විමර්ෂණයන්ට විශේෂිත අවධානයක් යොමු විය.

1. පන්සිළුගම සිදු වූ ඛේදවාදවාචකය (භික්ෂූන් වහන්සේලා කිහිප නමක් හදිසි අනතුරක් හේතුවෙන් අපවත් විය.)
2. විදුලි මෝටර් රථ ආනයනයේදී ශ්‍රී ලංකා රේගුව සමග එක්ව එම වාහන වල පිරිවිතර සම්බන්ධයෙන් ඇතැම් අවස්ථා වල පැන නැගුණු ගැටළු සම්බන්ධයෙන් වූ සාකච්ඡා වලට සහභාගී වීම.
3. දිවයින තුල සිදු වූ පහත හදිසි අනතුරු සම්බන්ධයෙන් කඩිනම් විශ්ලේෂණ සිදු කිරීම.
4. ඇල්ල බස් රථ අනතුර
5. ගැරඩිඇල්ල බස් අනතුර
6. බදුල්ල බස් අනතුර
7. කොළඹ වරාය පරිශ්‍රය තුල පුද්ගලයන් දෙදෙනෙකු හදිසි අනතුරකින් මිය යාම (නඩත්තු කටයුත්තකදී)
8. ඇල්ල බස් රථ අනතුරට අදාළ වැසි අංකය පරීක්ෂාව
9. දිවයිනේ විවිධ ප්‍රදේශ වල දී අත්අඩංගුවට ගන්නා වාහන වල වැසි අංක හා එන්ජින් අංක පරීකෂාව

04. පොදු කරුණු

- ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙහි ප්‍රශස්ත ලෙස ක්‍රියාකිරීමට හැකි පරිසරය වැඩි දියුණු කිරීම.
- විශ්ලේෂණය අවසන් කර ගත නොහැකිවූ නඩු භාණ්ඩ ප්‍රමාණය අඩුකිරීම.

  විශ්ලේෂණය සඳහා දැනට එක්රැස් වී ඇති නඩු භාණ්ඩ ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට නම් විද්‍යාත්මක සේවයේ නිලධාරීන් 50ක් වත් බඳවා ගත යුතුවේ. ඒ අනුව දැනට පුරප්පාඩු වී ඇති තනතුරු 35ට අමතර තනතුරු 38 වෙනුවෙන් ඉදිරියේදී මු.රෙ 71 යටතේ අනුමැතිය ඉල්ලීම් කිරීමට දෙපාර්තමේන්තුව අපේක්ෂාවෙන් සිටී. එමෙන්ම අනෙකුත් කාර්ය මණ්ඩල පුරප්පාඩුද හැකි ඉක්මනින් පුරවා ගත යුතුය. මෙසේ කිරීමෙන් බන්ධනාගාර තද බදය අවම කර ගැනීමත් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමත් සිදුකල හැකිවේ.

- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් 35 දෙනෙකු ඇතුළුව 2025.12.31 දිනට සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 114 ක් පවතී.

- මෙම පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු නොකළහොත්, විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම ප්‍රමාද වීම නිසා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ප්‍රමාද වන අතර එය බන්ධනාගාර තදබදයට ද හේතු වනු ඇත. එමෙන්ම මෙය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහිද අහිතකර ලෙස බලපායි.

- 2025 වර්ෂයේ ආරම්භයේ විශ්ලේෂණ සඳහා ඉතිරිව තිබූ නඩු භාණ්ඩ 30,220න් 24,641ක් 2025.12.31 දින වන විට අවසන් කර ඇත. තවද 2025 වර්ෂය තුලදී විශ්ලේෂණය සඳහා ලැබුණු නඩු භාණ්ඩ 70,846න් 32,769ක් 2025.12.31 දින වන විට අවසන් කර ඇත. කෙසේ වෙතත්, මත්ද්‍රව්‍ය රසායනාගාරයට පැමිණෙන නඩු භාණ්ඩ ප්‍රමාණය විශාල ලෙස වැඩිවීම නිසා විශ්ලේෂණය නොකර ඉතිරිවන නඩු භාණ්ඩ ප්‍රමාණය වැඩිවේ. මත්ද්‍රව්‍ය රසායනාගාරයට මසකට නඩු භාණ්ඩ 3500කට අධික ප්‍රමාණයක් ලැබෙන අතර නඩු භාණ්ඩ භාර ගැනීම, විශ්ලේෂණය කර අවසන් නඩු භාණ්ඩ නැවත භාර දීම, වාර්තා සකස් කිරීම සහ වාර්තා අත්සන් කිරීම වැනි කාර්යයන් සඳහා සැලකිය යුතු කාලයක් වෙන් කිරීමට සිදුවේ. එබැවින් සාමාන්‍ය පැය 08ක වැඩ දිනයක විශ්ලේෂණය සඳහා ඉතිරිවන්නේ සීමිත කාලයක් පමණි. තවද, ඔවුන් විසින් නිකුත් කරන ලද වාර්තා සඳහා විශේෂඥ සාක්ෂි සැපයීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් නිරන්තරයෙන් අධිකරණයේ පෙනී සිටීමද සිදු වේ. මෙම කරුණු හේතුවෙන් නිවාඩු දිනවල සහ සාමාන්‍ය කාර්යාල වේලාවෙන් බාහිරව කැපවී සේවය කළත් මසකට වාර්තා 1750-2000 කට වඩා සම්පූර්ණ කිරීම මත්ද්‍රව්‍ය අංශයට අභියෝගයක් විය. මෙම අංශයට අමතර නිලධාරීන් යෙදවිය යුතු බව පැහැදිලිය. ඒ අනුව වාර්තා නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා නිලධාරීගේ සහායට විශ්ව විද්‍යාල පුහුණු ශිෂ්‍යයින්ගේ සහාය ලබා ගැනීමද සිදුවිය. මේ අනුව මත්ද්‍රව්‍ය අංශය මගින් වාර්තා 2500ක් පමණ මසකදී නිකුත් කිරීමට හැකියාවක් ලැබුණි. එසේ නොමැති නම්, වැඩිවන නඩු භාණ්ඩ විශ්ලේෂණය ඵලදායී ලෙස කළමනාකරණය කළ නොහැකි වනු ඇත.

ලැබෙන නඩු භාණ්ඩ වල ප්‍රමාණය වැඩි වන විට, උපකරණ සංඛ්‍යාවද වැඩි කිරීමට සිදු වේ. ඊට සමගාමීව නිලධාරීන් සංඛ්‍යාවේ වැඩි වීමක්ද සිදුවිය යුතුයි. එපමණක් නොව, සීමිත රසායනාගාර ඉඩකඩ නිසා ගොඩනැගිලි පහසුකම් පුළුල් කිරීම ද අත්‍යවශ්‍ය වේ.

එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය
ආණ්ඩුවේ රස පරීක්ෂක

03 පරිච්ඡේදය


සමස්ථ මූල්‍යමය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

							ඒසිඒ-එෆ්
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය							
සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025			සටහන	තත්‍ය 2025		2024	
රු.				රු.		රු.	
-		ආදායම් ලැබීම්		-		-	
-		ආදායම් බදු	1	-		-	ඒසිඒ-1
-		දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-		-	
-		ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-		-	
-		බදු නොවන ආදායම් හා වෙනත්	4	-		-	
-		මුළු ආදායම් ලැබීම් (අ(		-		-	
-		ආදායම් නොවන ලැබීම්		-		-	
-		භාණ්ඩාගාර අග්‍රිම		864,868,000		645,517,091	ඒසිඒ-3
-		තැන්පතු		69,423,643		81,801,317	ඒසිඒ-4
-		අත්තිකාරම් ගිණුම්		10,513,756		9,493,176	ඒසිඒ-5
		වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		-	
-		මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		944,805,399		736,811,584	
-		මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ (ආ)+(අ) =		944,805,399		736,811,584	
		භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		2,145		7,046,973	
		ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබම් ඉ=ඇ-ඇ		944,803,254		729,764,611	
		අඩු කළා වියදම් :					
-		පුනරාවර්තන වියදම්		-		-	
272,500,000		වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	271,376,898		222,091,249	
460,250,000		අනෙකුත් භාණ්ඩ හා සේවා	6	445,844,921		409,204,606	ඒසිඒ-2(ii)
2,000,000		සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,388,953		1,533,286	
-		පොළී ගෙවීම්	8	-		-	
-		වෙනත් පුනරාවර්තන වියදම්	9	-		-	
734,750,000		මුළු පුනරාවර්තන වියදම් (ඊ)		718,610,771		632,829,141	

		මූලධන වියදම්					
13,300,000		මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	**12,565,899**		**2,890,790**	
221,750,000		මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	**210,478,498**		**587,385,576**	
-		ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	**-**		**-**	**ඒසිඒ-2(ii)**
-		මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	**-**		**-**	
20,000,000		හැකියා වර්ධනය	**14**	**19,827,606**		**16,138,210**	
-		වෙනත් මූලධන වියදම්	**15**	**-**		**-**	
255,050,000		මුළු මූලධන වියදම් (ඵ)		**242,872,003**		**606,414,576**	
-		තැන්පතු ගෙවීම්		**59,067,414**		**25,884,526**	**ඒසිඒ-4**
-		අත්තිකාරම් ගෙවීම්		**13,827,318**		**9,460,938**	**ඒසිඒ-5**
-		වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		**-**		**-**	
-		ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**72,894,732**		**35,345,464**	
-		මුළු වියදම් = (ඊ+උ+ඵ)		**1,034,377,506**		**1,274,589,181**	
989,800,000		දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (එ-ඉ)		**(89,574,252)**		**(544,824,570)**	
		අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**(89,574,252)**		**(545,711,804)**	**ඒසිඒ-7**
		දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**-**		**887,234**	**ඒසිඒ-3**

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය



එම්ඒ-8

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	එම්ඒ-6	3,446,578,897	3,266,024,462
මූල්‍ය වත්කම්			
අත්කිකාරම් ණයකරු	එම්ඒ-5/5(ඒ)	22,847,748	19,534,186
මුදල් හා මුදල් සමාන ද	එම්ඒ-3	-	887,234
මුළු වත්කම්		**3,469,426,645**	**3,286,445,882**
ඉක්මු වත්කම් / බැඳීම්			
භාණ්ඩාගාරය වෙත ඉක්මු වත්කම්		(46,371,017)	(39,328,350)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,446,578,897	3,266,024,462
මූලික හා වැඩි අත්කිකාරම් සංචිතය	එම්ඒ-5(බී)		
ස-ගති බැඳීම්			
තැන්පතු බැඳුම්	එම්ඒ-4	69,218,765	58,862,536
අනිත් බැඳීම	එම්ඒ-3	-	887,234
මුළු බැඳීම්		**3,469,426,645**	**3,286,445,882**

මිටු අංක 01 සිට 33 දක්වා එම්ඒ 1 සිට එම්ඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන සියලුම කොරතුරු සහ ඇතුළුකුම් මිටු අංක 34 සිට 58 දක්වා ඇතුළත් සියලුම සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්වලින් අත්තරගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සිදුකෙරෙ කිරීම රජයේ මූල්‍ය චරිතලාභී **150** සහ **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුම්වලින් සඳහන් කංචිත, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම කංචිතය සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමි.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය ගැලපෙන සඳහා වලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වර්තමානයේ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය ගැලපෙන සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සවලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති වලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට එමින් වර්ෂ සම්පාලනය සිදුකරන බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණකාධිකාරී නිලධාරියාධිපති නිසිඳු අයෙෂා පීතඛේතු
නම :
තනතුර :
දිනය : 2026.02.25

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමසාරිස් (මූල්‍ය)
නම :
දිනය : 2026/02/24

3.3 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		ඒසිඒසි-
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය		
	තක්ෂ	
		සංශෝධිත
	2025	2024
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	82,942,916	50,030,954
අග්‍රිම ලැබීම්	864,868,000	645,517,091
අත්තිකාරම් අයකර ගැනීම්	10,429,779	8,928,628
තැන්පතු ලැබීම්	69,423,643	23,434,931
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,027,664,338	727,911,604
අඩුකළා මුදල් වැය කිරීම් :		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	712,841,076	560,878,233
සහනාධාර සහ මාරුකිරීම්	1,388,953	1,533,286
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	32,393,505	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	34,755,352	15,500,691
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	2,145	7,046,973
අත්තිකාරම් ගෙවීම්	13,740,258	9,464,938
තැන්පතු ගෙවීම්	59,067,414	25,884,526
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	854,188,703	620,308,647
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ඇ=අ-ආ	173,475,636	107,602,957
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	80,330	249,556
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	80,330	249,556

<u>අඩුකළා මුදල් වැය කිරීම් :</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	**180,693,430**	**106,965,279**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**180,693,430**	**106,965,279**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය) ඊ=ඇ-ඉ	**(180,613,100)**	**(106,715,723)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය උ=ඇ+ඊ	**(7,137,464)**	**887,234**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	**-**	**-**
විදේශීය ණය ගැනීම්	**-**	**-**
ප්‍රදානයන් ලැබීම්	**6,250,230**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**6,250,230**	**-**
<u>අඩුකළා මුදල් වැය කිරීම් :</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	**-**	**-**
විදේශීය ණය ආපසු ගෙවීම්	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ඒ=ඌ-එ	**6,250,230**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් ඔ=උ+ඒ	**(887,234)**	**887,234**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**887,234**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**887,234**

3.4 මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

<u>වාර්තාකිරීමේ පදනම.</u>

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකිරීමේ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

*තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්කුවේ % ලෙස
20.02.01.01	රජයේ ගොඩනැගිලි කුලී	150,000.00	150,000.00	471,747.86	314%
20.03.02.99	අනෙකුත් ලැබීම්	20,000,000.00	20,000,000.00	64,372,702.61	322%
20.03.99.00	අනෙකුත් ලැබීම්	1,000,000.00	1,000,000.00	3,456,477.86	346%
20.02.02.99	අනෙකුත් ලැබීම් (පොළිය)	800,000.00	800,000.00	937,998.80	117%
20.04.01.00	අනෙකුත් ලැබීම්	-	-	13,571,256.49	
20.03.01.00		-	14,000.00	61,580.00	440%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

වැය විෂයය	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස
	වාර්ෂික අයවැය වෙන්කිරීම	මුළු ශුද්ධ වෙන් කිරීම		
පුනරාවර්තන	732,400,000	734,750,000	718,610,771	98%
මූලධන	246,400,000	255,050,000	242,872,003	95%
එකතුව	978,800,000	989,800,000	961,482,775	97%

3.7 මු.රෙ 208 අනුව ප්‍රතිපාදන පැවරීම

අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය	අරමුණ	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස
			වාර්ෂික අයවැය වෙන්කිරීම	මුළු ශුද්ධ වෙන් කිරීම		
අදාල නැත.						

3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය

වත්කම් කේතය	ජංගම නොවන වත්කම්	භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ 2025.12.31 දිනට ශේෂය	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ 2025.12.31 දිනට ශේෂය	තවමත් ගණන් ගත යුතු	වාර්තා ගත ප්‍රගතිය % ලෙස
9151	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1,150,546,868	1,150,546,868	-	100
9152	2.1 මෝටර් රථ වාහන	124,506,796	124,506,796	-	100
9152	2.2 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2,088.525,234	2,088.525,234	-	100
9153	ඉඩම්	83,000,000	83,000,000	-	100
9154	මූල්‍ය නොවන වතකම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	නොනිමි වැඩ	-	-	-	-
9180	කල්බදු වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/F/GAD/FS/02/2025 මෙම අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 31 දින

ආණ්ඩුවේ රස පරීක්ෂක
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත්කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1ති සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම, වත්කම හා බැරකම පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගෙන පූර්ව සැලසුම් සකස්කර ප්‍රතිපාදන වෙන්කර නොගැනීම සහ මනා කළමනාකරණයකින් යුක්තව ප්‍රතිපාදන වැයනොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයන් 10ක් සඳහා වෙන්කරන ලද රු.41,419,000කින් රු.8,049,790ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. වැය විෂයන්වල එසේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 10 සිට සියයට 41 අතර පරාසයක් වී තිබුණි.

(ආ) මූදල් රෙගුලාසි 50 ප්‍රකාරව මූදල් වර්ෂය තුළ තම දෙපාර්තමේන්තුවට ඉටුකළ හැකි ශක්තිය ඇතුළත, සහේතුකව පූර්වානුමානකළ හැකි සියලුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුළත්කර ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මූළු ශුද්ධ ප්‍රතිපාදනය හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය අතර වෙනස ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 100 සිට සියයට 136 දක්වා පරාසයකින් වෙනස් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 14ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන්ට අමතරව මූදල් රෙගුලාසි 66 යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කළ රු.67,324,127ක ප්‍රතිපාදන මාරුකර තිබුණි. මෙම මාරු කිරීමට අමතරව එක් වැය විෂයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.11,000,000ක් ලබාගෙන තිබුණි. වැය විෂයන් අතර එලෙස මාරුකිරීමේ ප්‍රතිශතය සියයට 5 සිට සියයට 136 අතර පරාසයක් ගෙන තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

(අ) සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ සහ භාණ්ඩාගාර මූදිත සටහන් (SA 92) තුළ ඇතුළත් නොවූ රු.6,745,597ක් වූ බැරකම් 2026 වර්ෂයේ දී නිරවුල්කර තිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන මූදල් අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 03 ඡේදයට අනුව බැඳීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි යාවත්කාලීන කර ඇති සිංහල් ගිණුම්කරණ පද්ධතියට බැඳීම් හා බැරකම්වලට අදාළ ගනුදෙනු සම්බන්ධ ක්‍රියාවලියේ සියලුම පියවරයන් ඇතුළත්කළ යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i) - ඇමුණුම (iv)හි රු.1,430,479ක බැරකම්, භාණ්ඩාගාර මූදිත සටහන් (SA 92) තුළ ඇතුළත්කර නොතිබුණි. ඒ අනුව භාණ්ඩාගාර මූදිත සටහන් හා බැරකම් ප්‍රකාශනය අතර රු.1,430,479ක වෙනසක් පැවතුණි.

(ඇ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන මූදල් අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුව පුද්ගල පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා වාර්ෂික අයවැය සීමාව තුළ ප්‍රථමයෙන් බැඳීම් හඳුනාගත යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයන් 06ක් සඳහා එළැඹිය හැකි උපරිම බැඳීම් සීමාව රු.478,640ක් වුව ද, ඊට පටහැනිව 2026 වර්ෂයේ දී මෙම වැය විෂයන් 06 සඳහා රු.6,501,206ක බැරකම් නිරවුල්කර තිබුණි.

3.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවකිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 06 ඡේදයේ සඳහන් ඇවුණුම් අනුව වර්ෂයේ මිලදීගන්නා හෝ අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු කොමිප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත්කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ දී මිලදීගත්- රු.197,795,137ක් වටිනා වත්කම් පිළිබඳව සහ වර්ෂය තුළ දී අපහරණය කරන ලද රු.17,240,702ක් වටිනා වත්කම් පිළිබඳව ඇවුණුමේ සඳහන් ආකාරයට (එක් එක් වත්කම් පිළිබඳව තොරතුරු) කොමිප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කර නොතිබුණි.

1.6.2 මූල්‍ය වත්කම්

දෙපාර්තමේන්තුවේ පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ ආරම්භක ශේෂය රු.19,513,526ක් වූ අතර, එම ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 52) අනුව රු.19,534,186කි. ඒ අනුව ආරම්භක ශේෂ අතර රු.20,660ක වෙනසක් නිරීක්ෂණය විය. වර්ෂය අවසානයේ දී ද මෙම වෙනස දක්නට ලැබෙන අතර, මෙය 1997 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන ශේෂ වෙනසක් වන අතර, එය සමාලෝචිත වර්ෂයේ දී ද නිවැරදි කිරීමට කටයුතුකර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

(අ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථානයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1.3 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොනිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොනිබුණි.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2010 ජූලි මස 09 දිනැති අංක CA/1/1/16/1 දරන හා 1993 දෙසැම්බර් 31 දිනැති අංක පීපීඒ/6/1/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල විසින් නිකුත්කළ වක්‍රලේඛය	රජයේ නිලධාරීන් විදේශ නිලසංචාරයක යෙදී ආපසු දිවයිනට පැමිණීමෙන් දින 07ක් තුළ එම වක්‍රලේඛයෙහි "ඊ" ඇමුණුමෙහි ඇති ආකෘතිය අනුව වාර්තාවක් විදේශ ගමන අනුමතකළ නිලධාරියා වෙත ඉදිරිපත්කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් අටදෙනෙකු විසින් විගණිත දිනය වූ 2026 මැයි 15 දින වන තුරු එම වාර්තා ඉදිරිපත්කර නොනිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) V වැනි පරිච්ඡේදයෙහි 7.1 ඡේදය	නිලධාරිනියක් වැටුප් රහිත අධ්‍යන නිවාඩු 2024 දෙසැම්බර් 26 දිනෙන් අවසන් වී එදින සිට සේවයට නොපැමිණිය ද, 2025 ඔක්තෝබර් 15 දින වන තෙක් තනතුර අතහැරයාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතුකර නොනිබුණි.
(ii) XV පරිච්ඡේදයෙහි 5.2 ඡේදය	අනිවාර්ය සේවා කාලය කිරීමට අපොහොසත් වීම නිසා (i)හි සඳහන් නිලධාරිනියගෙන් අයකරගත යුතු වූ රු.469,680ක දණ්ඩනා මුදල අයකර ගැනීමට කටයුතුකර නොනිබුණි.
(iii) XV පරිච්ඡේදයෙහි 10.1 ඡේදය	සමාලෝචිත වර්ෂය තුළ විදේශගත වූ නිලධාරීන් 04දෙනෙකු සංචාරය නිමකර දිවයිනට පැමිණිය ද, 2026 මැයි 15 දින වනතුරු අමාත්‍යාංශ අනුමැතිය ලැබී නොනිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 104(1) (අ)	දෙපාර්තමේන්තුවට අයත් මෝටර් වාහන තුනකට අදාළව සිදු වී තිබුණු හදිසි අනතුරු සම්බන්ධයෙන් මූලික

3.5 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මාස 06ට වැඩි කඳුනාගොගත් ලැබීම් රු.104,400ක් නිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් 2025 ජූලි 24 දින Fetch Consultants (pvt) Ltd වෙත ලියන ලද අංක 669092 දරන රු.30,000ක් වටිනා චෙක්පත භාරදීමකින් තොරව සේප්පුවේ ඛහා තිබූ අතර, එය කල්ඉකුත් වී නිබුණ ද, ඒ සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි 391 අනුව කටයුතුකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්ම වර්ෂය තුළ දී සංශෝධනයකර නිබුණ ද, ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම නිසියාකාරයෙන් පිළියෙල නොකිරීම හේතුවෙන් වැය විෂයන් 03ක් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය වර්ෂය තුළ දී සංශෝධනයකර තිබූ අතර, ඊට අමතරව මූදල් රෙගුලාසි 66 මාරුකිරීම මගින් ද ඒ සඳහා ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

(අ) ආහාර අංශයෙහි හැර අනෙකුත් සියලුම අංශයන්හි සමාලෝචිත වර්ෂයෙහි අවසානයට කවදුරටත් විමර්ශනය කිරීම සඳහා නඩුභාණ්ඩ 43,656ක් ඉතිරිවී තිබුණි. එයින් මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශයෙහි පරීක්ෂා කිරීම සඳහා අත ඉතිරි නඩුභාණ්ඩ ප්‍රමාණය 29,286ක කැපී පෙනෙන අගයක් එනම් සියයට 67ක්ව පැවතිය අතර, වාර්තා නිකුත්කිරීම ප්‍රමාදවීම හේතුවෙන් රිමාන්ඩ් භාරයේ සිටින සැකකරුවන් ප්‍රමාණය වැඩිවීම නිසා බන්ධනාගාර තදබදය ඇතිවීම මෙන්ම මෙම එක් සැකකරුවෙකු නඩත්තු කිරීමට දිනකට වැයවන රු.1,411ක මූදල් රජයට අමතර වැයබරක් වන බව ද, නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා නඩුභාණ්ඩ 70,846ක් ලැබී තිබූ අතර, ඉන් වර්ෂය තුළ දී නඩුභාණ්ඩ 32,769ක් සඳහා එනම් සියයට 46ක් සඳහා වාර්තා ලබා දී තිබුණි.

4.1.3 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූදල් වර්ෂය අවසාන වී දින 180ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත්කළ යුතු වුවත්, 2024 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 15 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කර තිබුණි.

		පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අදාළ කමිටු පත් කිරීමට වර්ෂයක කාලයක් ලබාගෙන තිබුණි.
	(ii) මූදල් රෙගුලාසි 110(1)	හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන ගිය ද, එය යාවත්කාලීන කර නොතිබුණි.
	(iii) මූදල් රෙගුලාසි 115	දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ සේවා සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු ඒ ඒ වර්ෂවල ලද වහාම රජයේ ආදායමට බැරකර තිබුණ ද, එයින් නිලධාරීන්ට අදාළ දීමනාව ගෙවීමේ දී පසුගිය වර්ෂවලට අදාළ මූදල් ද සමාලෝචිත වර්ෂයේ දී අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.
	(iv) මූදල් රෙගුලාසි 772 (3)	සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කරන ලද රු.17,240,703ක් වටිනා යන්ත්‍රසූත්‍ර සහ කාර්යාල උපකරණවලට අදාළව ගබඩා සටහන්වලින් ඉවත්කර නොතිබුණි.
(ඇ)	2016 අගෝස්තු 02 දිනැති අංක PF/R/04/08/01(13) දරන රාජ්‍ය මූදල් අධ්‍යක්ෂ ජනරාල් ලිපිය	දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ නිලධාරීන් සිය සේවා කාලයෙන් පරිබාහිරව ඉටුකරනු ලබන සේවාවන් වෙනුවෙන් ලබාගන්නා ගාස්තුව, වසර 03කට වරක් සමාලෝචනයකර නිසිපරිදි සංශෝධනය කිරීමට පියවර ගත යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ අනුමතකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයම සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගෙන තිබුණි.
(ඈ)	2024 පෙබරවාරි 06 දිනැති අංක 08/2019 (ii) දරන රාජ්‍ය මූදල් දෙපාර්තමේන්තුවේ මූදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2 ඡේදය	දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන කටයුතු කිරීමේ දී e-GP System වෙත ලියාපදිංචි විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි 880, 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇපආඥා පනතට හා 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන අධිකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය	ගණකාධිකාරී, මූදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මූදල් තැන්පත්කර නොතිබුණි.
(ඊ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව. භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.1.1(ඇ) , 4.1.2 සහ 4.1.3(ඇ) ඡේද	ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ක්‍රියාකාරකම් සම්පූර්ණකර පිළියෙලකළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, එළැඹෙන මූල්‍ය වර්ෂය තුළ සිදුකළ යුතු ප්‍රසම්පාදනයන් නිරූපණය කරමින් වාර්ෂික ඒකාබද්ධ ප්‍රසම්පාදන සැලැස්ම සහ සියලුම ගණන්දීමේ නිලධාරීන් විසින් පිළියෙලකළ යුතු සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම නියමිත කාලරාමුව තුළ පිළියෙල කොට ඉදිරිපත්කර නොතිබුණි.

4.2 පාඩු හා හානි

(අ) 2003 පෙබරවාරි 14 දින සිදු වූ රු.2,229,111ක ගිනිඅනතුරු අලාභය, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණ ද, එය පොත්වලින් කපාහැරීමට සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ රිය අනතුරු 04ක් සම්බන්ධයෙන් රක්ෂණ සමාගමෙන් අයකරගනු ලැබූ රු.66,000ක මුදල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය තුළ ඇතුළත්කර තිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

(අ) මධ්‍යසාර විශ්ලේෂක අංශය, ආහාර විද්‍යා අංශය, සැක කටයුතු ලේඛන අංශය සහ අධිකරණ වූලක විද්‍යා අංශය හැර අනෙකුත් සියලු අංශවල පරීක්ෂණ අවසන්කර වාර්තාව ඉදිරිපත්කර ඇති නඩුභාණ්ඩ බැහැරකිරීම සිදුනොකිරීම නිසා ගබඩාවල ඉඩකඩ සීමිත වී තිබුණි. 1988 අංක 69 දරන පනත මඟින් භාණ්ඩ බැහැරකිරීම සඳහා දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන සලසා දී ඇති නමුත්, එම ගැටලුව නිරාකරණයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක අංශයෙහි පරීක්ෂාව සඳහා සාම්පල් පමණක් දෙපාර්තමේන්තුව වෙත රැගෙන ඒම වෙනුවට සම්පූර්ණ භාණ්ඩ ප්‍රමාණයම අංශයට රැගෙන ඒම නිරීක්ෂණය වූ අතර, සාම්පල් භාරගන්නා අවස්ථාවේ දී පරීක්ෂණ කිරීමට පෙර අදාළ මූලික කාර්යයන් (හෙරොයින් පරීක්ෂණ) සිදුකිරීමට අනවශ්‍ය කාලයක් වැයවන බව ද නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ගබඩා පහසුකම් ද සීමිත වී තිබූ අතර, මෙම ගැටලුව නිරාකරණයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ අධිකරණ මස්තු විද්‍යා හා ඩීඑන්ඒ අංශය මඟින් ඩීඑන්ඒ වාර්තාවක් නිකුත්කිරීමේ දී අදාළ පොලිස් ස්ථානයෙන් ගාස්තුවක් අයකරනු ලබන අතර, 2014 වර්ෂයේ සිට 2023 දක්වා එසේ අයකරගත යුතුව තිබූ රු.9,129,750ක් වූ මුදල අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

5. නිරසාර සංවර්ධනය

5.1 නිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය

දෙපාර්තමේන්තුව විසින් නිරසාර සංවර්ධන අරමුණක් හඳුනාගෙන ඒ සඳහා ඉලක්කයන් ද හඳුනාගෙන තිබූ අතර, එම ඉලක්ක ළඟාකර ගැනීමට දර්ශක පිළියෙළකර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂවල ලැබුණු විශ්ලේෂණය සඳහා නවදුරටත් ඉතිරිව ඇති නඩුභාණ්ඩ/ සාම්පල/ පරීක්ෂණවලට අදාළ විශ්ලේෂණ වාර්තා ප්‍රවර්ථන වර්ෂය තුළ නිකුත්කර අවසන්කිරීම ඉලක්කකර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙසේ විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීමට තිබූ නඩුභාණ්ඩ 43,656න් නඩුභාණ්ඩ 5,579ක් එනම් සියයට 14ක් 2019-2023 කාලපරිච්ඡේදයට අදාළ බව නිරීක්ෂණය විය.

6. යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

ආයතනයේ කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට උපකාරීවන තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 40ක සහ තෘතීයික මට්ටමේ නිලධාරීන් 9ක තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වන නඩුභාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත්කරන විද්‍යාත්මක වාර්තා මාස තුනක කාලයක් ඇතුළත ලබාදීමට බාධාවක් වී තිබූ අතර, මෙම ප්‍රමාදය පොලිසිය සහ බන්ධනාගාරයෙහි කටයුතුවලට මෙන්ම ආයතනයේ කාර්යක්ෂමතාවයට ද බාධාවක් වී තිබුණි.

කේ.කේ.ඩබ්ලිව්.කොඩ්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තු කාර්යසාධන දර්ශක

දර්ශකය	2025 වර්ෂයේ ඉලක්ක	2025 වර්ෂයේ ඉලක්ක (ප්‍රතිශතය)	සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස
• වර්ෂය තුළ ඉදිරිපත් වන නඩු භාණ්ඩ/සාම්පල/පරීක්ෂණ විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර අවසන් කිරීම.	41,000	90%	80%
• පෙර වර්ෂ වල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/සාම්පල/පරීක්ෂණ වලට අදාල විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත් කර අවසන් කිරීම.	13,800	100%	179%
• ස්ථානීය පරීක්ෂණ හා විශේෂඥ සාක්ෂි සඳහා අධිකරණයේ පෙනී සිටීම	දින 650	100%	121%
• මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව ධාරිතා සංවර්ධනය	235	100%	131%

05 පරිච්ඡේදය

සුහුරු සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම පිළිබඳ ප්‍රගතිය

අරමුණ	ඉලක්කය	ලඟා කර ගැනීමේ දර්ශක	නිවැරදි දිනට ලඟාකර ගැනීමේ ප්‍රගතිය
සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන 2030 වර්ෂය වන විට නීතිය හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා නඩු භාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත් කරන විද්‍යාත්මක වාර්තා මාස 03ක කාලයක් තුල ලබාදීමට කටයුතු කිරීම.	තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුලත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායී, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම.	• වර්ෂය තුළ ඉදිරිපත් වන නඩු භාණ්ඩ/ සාම්පල/පරීක්ෂණ විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර අවසන් කිරීම.	79%
		• පෙර වර්ෂ වල ලැබුණු විශ්ලේෂණය සඳහා තවදුරටත් ඉතිරිව ඇති නඩු භාණ්ඩ/සාම්පල /පරීක්ෂණ වලට අදාල විශ්ලේෂණ වාර්තා ප්‍රවර්තන වර්ෂය තුළ නිකුත් කර අවසන් කිරීම.	176%
		• අපරාධ ස්ථාන පරීක්ෂාවට අදාල වාර්තා නියමිත කාලය තුළ නිකුත් කිරීම.	104%
		• මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව ධාරිතා සංවර්ධනය	131%

06 පරිච්ඡේදය

මානව සම්පත් කළමනාකරණය හා පරිපාලනය

6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය

සේවක කාණ්ඩ මට්ටම	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	125	85
තෘතීය මට්ටම	10	1
ද්විතීය මට්ටම	136	97
ප්‍රාථමික මට්ටම	84	58
එකතුව	**355**	**241**

6.2 කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්ත

	තනතුර	සේවය	ශ්‍රේණිය	ඩැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව			දැනට සිටින සේවක සංඛ්‍යාව				පුරප්පාඩු
					ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	වෙනත් (මැදි බලන)	
1	ආණ්ඩුවේ රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	1	-	-	1	-	-	-	0
2	ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	2	-	-	-	-	-	2	2
3	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක	SLSS	Sp.	SL 3	1	-	-	1	-	-	-	0
4	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක	SLSS	I	SL 1	8	-	-	7	-	-	-	1
5	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක	SLSS	I	SL 1	2	-	-	2	-	-	-	0
6	අධ්‍යක්ෂ (පරිපාලන) ශ්‍රී.ල.ප.සේ.1 පන්තිය	SLAS	I	SL 1	1	-	-	1	-	-	-	0
7	ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ.1 පන්තිය	SLAcS	I	SL 1	1	-	-	1	-	-	-	0
8	අභ්‍යන්තර විගණක	SLAcS	II/III	SL 1	1	-	-	0	-	-	-	1
9	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක/සහකාර රස පරීක්ෂක	SLSS	II/III	SL 1	93	-	-	64	-	-	-	29
10	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ පරීක්ෂක/සහකාර පරීක්ෂක	SLSS	II/III	SL 1	14	-	-	8	-	-	-	6
11	ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. 111 පන්තිය	SLAcS	II/III	SL 1	1	-	-	0	-	-	-	1
	ජ්‍යෙෂ්ඨ මට්ටම එකතුව				**125**	-	-	**83**	-	-	**2**	**40**
12	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී (අධි පන්තිය)	SLTS Supra	Sp.	MN -7	5	-	-	0	-	-	-	5
13	පරිපාලන නිලධාරී	PMAS Supra	Sp.	MN -7	1	-	-	-	-	-	-	1
14	භාෂා පරිවර්තක සේවය	TS	III	MN -6	2	-	-	2	-	-	-	0
15	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (2 පන්තියේ 11/1 ශ්‍රේණිය)	SLICTS	II	MN -6	2	-	-	1	-	-	-	1
	තෘතීය මට්ටම එකතුව				**10**	**0**	**0**	**3**	**0**	**0**	**0**	**7**
16	පර්යේෂණ නිලධාරී	Dept	I/II/III	MN -4	1	-	-	1	-	-	-	0
17	සංවර්ධන නිලධාරී	DOS	I/II/III	MN -4	22	-	-	10	-	-	-	12
18	පුස්තකාලයාධිපති	SLGLS	I/II/III	MN -3	1	-	-	0	-	-	-	1

19	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී	Dept	I/II/III	MN -3	50	-	-	46	-	-	-	4
20	කාර්මික නිලධාරී	Dept	I/II/III	MN -3	1	-	-	0	-	-	-	1
21	කළමනාකරණ සේවා නිලධාරී	MSO	I/II/III	MN -2	36	-	-	21	-	-	-	15
22	යතුරු ලේඛක	Dept	I/II/III	MN -2	15	-	-	5	-	-	-	10
23	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන සහකාර	SLICTS	I/II/III	MT-1	10	-	-	4	-	-	-	6
	ද්විතීය මට්ටම එකතුව				**136**	**0**	**0**	**87**	**0**	**0**	**0**	**49**
25	රියදුරු සේවය	DS	Sp/I/II/ III	PL-3	21	-	-	18	-	-	-	3
26	රසායනාගාර සහායක	Dept	I/II/III	PL-2	12	-	-	2	-	-	-	10
27	ගොඩනැගිලි නඩත්තු සහායක	Dept	I/II/III	PL-2	2	-	-	0	-	-	1	2
28	පුස්තකාල සහායක	Dept	I/II/III	PL-2	1	-	-	1	-	-	-	0
29	කාර්යාල සේවක සේවය	OES	Sp/I/II/ III	PL-1	38	-	-	29	-	-	-	9
30	විද්‍යාගාර ඕඩර්ලි	Dept	I/II/III	PL-1	10	-	-	8	-	-	-	2
	ප්‍රාථමික මට්ටම එකතුව				**84**	**0**	**0**	**58**	**0**	**0**	**1**	**26**
	මුළු එකතුව				**355**	**0**	**0**	**241**	**0**	**0**	**3**	**114**

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු හා විදේශීය පුහුණු

අංකය	නම	තනතුර	පාඨමාලාව	පුහුණු කාලය	පැවැත්වූ ස්ථානය
1	ඩබ්. ඒ.ආර්. ප්‍රනාන්දු මයා	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක	Annual Scientific Session of the Medico Legal Society	2025.02.08	Medico Legal Society premises - Colombo
2	කේ.ඒ.ඩී.සී. කොඩිතුවක්කු මිය	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක			
3	එල්.එස්. හතුරුසිංහ මිය	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක			
4	වයි.එම්.ඩබ්.එස්. බණ්ඩාර මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
5	එන්.අයි.කේ. ප්‍රනාන්දු මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
6	ආර්.ඩබ්.ආර්.කේ. රත්නායක මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
7	පී.ජී. ද සිල්වා මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
8	ඩබ්.එම්.එස්.ආර්. රත්නායක මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
9	ඩබ්.එම්. ඒ. කුමාර මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
10	එල්.ඒ.ඩබ්.කේ. දහනායක මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
11	ඩී.එම්.ජී.සී. බණ්ඩාර මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			

12	ඊ. මාරසිංහ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
13	යූ.ජී.එස්.ටී. ගමගේ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
14	එල්.ආර්.ටී. පෙරේරා මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
15	යූ.එම්.එස්. ප්‍රේමතිලක මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
16	ඩබ්.ඒ.එච්. සංජය මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
17	කේ.ඩී.ඩබ්. පංචමී මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
18	ආර්.ඒ.බී.එස්. රණසිංහ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
19	ඩබ්.එස්.එච්.කේ. ජයවංශ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
20	ඩබ්.ඩබ්.එච්.වේරගල මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
21	බී.එම්.එස්. ජිශාන් මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
22	ආර්.එම්.එල්.එස්. රත්නායක මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
23	කේ.වී.පී. සංජීවනී මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
24	ඩබ්.එම්.පී.ඩී.කේ. විජේතුංග මය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
25	ඊ.ජී.ආර්. තක්ශිලා මෙය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
26	කේ.පී.සිරිවර්ධන මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
27	එච්.ඒ.කේ.එල්. මංජුල මයා	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
28	බී.ඩබ්.වී. විද්‍යා මිය	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			

අංකය	නම	තනතුර	පාඨමාලාව	පුහුණු කාලය	පැවැත්වූ ස්ථානය
1	එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක	අමාත්‍යාංශයේ විධායක නිලධාරීන් සම්බන්ධයෙන් වන “AI for Transforming Public Service” පුහුණු	2025.08.12	ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
2.	ඩබ්.ඒ ආර්. ප්‍රනාන්දු මයා	ආණ්ඩුවේ නියෝජ්‍ය රස			

		පරීක්ෂක	වැඩසටහන		
3.	කේ.ඒ.එස්.අයි. කේ. කළුආරච්චි මයා	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක			
4.	එල්.එස්. හතුරුසිංහ මිය	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක			
5.	ඩබ්. පී. අයි. උදයංගනී	ප්‍රධාන ගණකාධිකාරී			
6.	යූ. එල් කත්‍රිආරච්චි මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
7.	සී.පී. කුමාරපේලි මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
8.	ආර්.ඩබ්.ආර්.කේ රත්නායක මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
9.	අයි.ජේ.අඹේපිටිය මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
10.	ඩබ්.එම්.එස්.ආර්. රත්නායක මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
11.	ඩබ්.එම්.ඒ. කුමාර මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
12.	එස්.එල්. ගුණවර්ධන මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
13.	ඩබ්.පී.ඒ.ආර්.ඩී. බණ්ඩාර මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
14.	ඩී.ආර්.අයි. උදේශිනී මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
15.	පී.ජී.පී. චන්ද්‍රසිරි මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
16.	ඩබ්.ඒ.එච්. සංජය මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
17.	ඊ.එම්.ඩී.ටී. ඊ. උඩංගමුව මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
18.	ඩබ්.එස්.එච්.කේ. ජයවංශ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
19.	ඩබ්.ඩබ්.එච්. වේරගල මයා	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
අංකය	**නම**	**තනතුර**	**පාඨමාලාව**	**පුහුණු කාලය**	**පැවැත්වූ ස්ථානය**
1	කේ.කේ. අප්සරා මෙය	සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක	අමාත්‍යාංශයේ විධායක නිලධාරීන් සම්බන්ධයෙන් වන “AI	2025.09.12	ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

2	කේ.ඒ.ඩී.සී. කොඩිතුවක්කු මිය	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක	for Transforming Public Service” පුහුණු වැඩසටහන		
3	කේ.වී. රත්නපාල මිය	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක			
4	ඩබ්.එම්.පී.බී.කේ. වර්ණසූරිය මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
5	වී.එස්. ජයසේකර මිය	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක			
6	එන්.අයි.කේ. ප්‍රනාන්දු මිය	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක			
7	පී.ජී.ද සිල්වා මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
8	ටී.යූ. වීරරත්න මිය	සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක			
9	වයි.එම්.ඩබ්.එස්. බණ්ඩාර මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
10	එච්.ඩබ්.සී.සී. කරුණාරත්න මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
11	එස්.එල්.ආර්. ගුණවර්ධන මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
12	එම්.ඒ.ජේ. ප්‍රනාන්දු මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
13	එස්.එම්.වී.ඩී. මාලා මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
14	එල්.එ.ඩබ්.කේ. දහනායක මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
15	ටී.ආර්.එම්.සී. දිල්හානි මැණිකේ මෙය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
16	එම්.ඊ.ජේ. සෙනෙවිරත්න මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
17	අයි.එච්. කුලතුංග මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
18	ඩී.එම්.ජී.සී. බණ්ඩාර මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
19	ඊ. මාරසිංහ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
20	ඒ. එස්. සපුතන්ත්‍රී මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
21	ටී.එච්. කුරුකුලනාථ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			

22	ටී.එම්.පී.ජී.සී.ආර්. සෙනෙවිරත්න මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
23	ඩී.ආර්. අයි. උදේශිනී මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
24	එස්. කුලලි මෙය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
25	යූ.ජී.එස්.ටී. ගමගේ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
26	එල්.ආර්.ටී.පෙරේරා මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
27	යූ.ඩබ්.එස්. ප්‍රේමතිලක මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
28	සී. එන්. කුලසේකර මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
29	ඩබ්.ඒ.අයි. ඩී. ප්‍රේමවන්ද්‍ර මිය	සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර පරීක්ෂක			
අංකය	**නම**	**තනතුර**	**පාඨමාලාව**	**පුහුණු කාලය**	**පැවැත්වූ ස්ථානය**
1	ඩබ්.ඒ ආර්. ප්‍රනාන්දු මයා	නියෝජ්‍ය රස පරීක්ෂක	A Regional Terrorism and Weapons of Mass Destruction (WMD) Workshop	2025.09.15 - 2025.09.19	කොළඹ
අංකය	**නම**	**තනතුර**	**පාඨමාලාව**	**පුහුණු කාලය**	**පැවැත්වූ ස්ථානය**
1	ටී.එම්.පී.ජී.සී.ආර්. සෙනෙවිරත්න මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	Implement and maintain ISO 17025:2917 Laboratory Management System	2025.03.22	Fetch Consultant (PVT) Ltd - (HARTI)
2	ජී.ඩී.ඒ.පී. සේනාරත්න මයා	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
අංකය	**නම**	**තනතුර**	**පාඨමාලාව**	**පුහුණු කාලය**	**පැවැත්වූ ස්ථානය**
1	ඩී.ආර්.අයි. උදේශිනී මිය	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක	Laboratory Safety Management by UNIDO	2025.05.27	කොළඹ
2	ඊ. ජී.ආර්. තක්ශිලා මිය	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
3	ඩබ්.ඒ.ඩී.එස්.ඒ. විජේසිංහ මිය	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
4	ඩී. ඒකනායක මයා	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී			
5	එස්.එම්.වී.ඩී. මාලා මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක		2025.06.12	
6	ඩබ්.එස්.එච්.කේ. ජයවංශ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			

7	ටී.එම්.වී. දේශාන් මයා	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
8	බී.එච් මධුෂිනී මෙය	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
අංකය	නම	තනතුර	පාඨමාලාව	පුහුණු කාලය	පැවැත්වූ ස්ථානය
1	එම්. සමරගුණරත්න මිය	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී	Safe Chemical Handling and Risk Management	2025.05.28	(HARTI)
2	ටී.ඩී.එස්. කෞෂල්‍යා මිය	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී			
3	එ.කේ.ඩී.එස්. සංජීව මයා	රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී			
4	ඩී.එච්.යූ. රාජකරුණා මිය	රසායනාගර සහයක			
අංකය	නම	තනතුර	පාඨමාලාව	පුහුණු කාලය	පැවැත්වූ ස්ථානය
1	වී.එස්. ප්‍රියදර්ශනී මිය	සංවර්ධන නිලධාරී	නිවාඩු ලිපිකරුවන්ගේ කාර්ය භාරය		SDFL
2	වී.එස්. ප්‍රියදර්ශනී මිය	සංවර්ධන නිලධාරී	කාර්යාල කළමනාකරණය හා කාර්ය පටිපාටික රීති	2025.08.28	DLC
3	පී.ටී. රසාංගිකා මෙය	සංවර්ධන නිලධාරී			
4	එච්.පී.යූ.කේ. හේවාපතිරණ මයා	කළමණාකරන සේවා නිලධාරී	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	2025.06.12	කොළඹ
5	එච්.කේ.එන්. හපුආරච්චි මිය	කළමණාකරන සේවා නිලධාරී	රජයේ මුදල් රෙගුලාසි	2025.07.04	SDFL
6	අයි.ජී.ඩී. ඉශානි මිය	සංවර්ධන නිලධාරී	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024	2025.11.03	DLC
7	ඩබ්.කේතළුල් මධුශානි මිය	කළමණාකරන සේවා නිලධාරී			
Programmes conducted by UNODC for Government Analyst's Department Officers - 2025					
	Name of the Officer	**Designation**	**Traininng/ Workshop/Event details**	**Date**	**Vanue**
1	Mrs. P.G.De Silva	Senior Assistant Government Analyst	GMCP Integrated Training Package	from 26th – 30th May 2025, 02 to 06 June 2025, 09-13 June 2025 and 18-20 June 2025	at Trincomalee Navy Base
2	Ms. K.M.D.S. Subaseela	Assistant Government Analyst			
3	Mrs. M.A.J. Fernando	Senior Assistant Government Analyst	Validation Workshop of Collaborative Framework for Evidence Collection at Sea and Chain of Custody Procedures	29-30 April 2025	Colombo
4	Mrs. T.H. Kurukulanatha	Senior Assistant Government Analyst			

5	Mrs. M.A.J. Fernando	Senior Assistant Government Analyst	Events related to the Development of a Collaborative Framework for Evidence Collection at Sea and Chain of Custody Procedures in Sri Lanka (Drafting Workshop of a Collaborative Framework on Evidence Collection at Sea and Chain of Custody Procedures in Sri Lanka	28-30 January 2025	Colombo
6	Mr. E.M.D.T.E. Udangamuwa	Senior Assistant Government Examiner of Questioned Documents	Events related to the Development of a Collaborative Framework for Evidence Collection at Sea and Chain of Custody Procedures in Sri Lanka (Maritime Law Enforcement (MLE) Agencies and Criminal Justice Practitioners on Developing a Collaborative Framework on Evidence Collection at Sea and Chain of Custody Procedures in Sri Lanka)	16-17 January 2025	Colombo
7	Mrs. K.A.D.C. Kodithuwakku	Deputy Government Analyst	National Consultation Related to Operational Analysis on Drug Seizures Leading on Prosecution	15. January 2025	Colombo
8	Mrs. K.V. Rathnapala	Deputy Government Analyst			
අංකය	**නම**	**තනතුර**	**පාඨමාලාව**	**ප්‍රහුණු කාලය**	**පැවැත්වූ ස්ථානය**
1	එස්.එල්.ආර්. ගුණවර්ධන මිය	ආණ්ඩුවේ ප්‍රොෂ්ය සහකාර රස පරීක්ෂක	KOICA Expert Dispatch and 2nd Local Training Under 'Strengthen Capacity Building Forensic Drug Analysis in the Criminal Justice Sysytem in Sri Lanka'	2025.03.05 - 2025.03.28	ආ.ර.ප.දෙ.
2	එම්.ඒ.ජේ. ප්‍රනාන්දු මිය	ආණ්ඩුවේ ප්‍රොෂ්ය සහකාර රස පරීක්ෂක			
3	එල්.එ.ඩබ්.කේ. දහනායක මිය	ආණ්ඩුවේ ප්‍රොෂ්ය සහකාර රස පරීක්ෂක			
4	එම්.ඊ.ජේ. සෙනෙවිරත්න මිය	ආණ්ඩුවේ ප්‍රොෂ්ය සහකාර රස පරීක්ෂක			
5	ඩී. ආර්. අයි. උදේශිනී	ආණ්ඩුවේ ප්‍රොෂ්ය සහකාර			

		රස පරීක්ෂක			
6	ටී.එච්. කුරුකුලනාථ මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
7	ටී.එම්.පී.ජී.සී.ආර්. සෙනෙවිරත්න මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
8	පී.ජී.පී. චන්ද්‍රසිරි මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
9	එච්. එන්. ඒ. පෙරේරා මිය	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
10	එච්.එස්.ටී. කෞශල්‍යා මිය	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
11	ඩබ්. එම්.පී.ඩී.කේ. විජේතුංග මිය	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
12	ජී.ඩී.ඒ.පී. සේනාරත්න මයා	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
13	ඊ.ජී.ආර්. තක්ශිලා මිය	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
14	එල්.එස්. ආර්. ලියනගේ	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			
15	ජී.ඩී.එන්.එච්. ගුණරත්න	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක			

	Name of the Officer	**Designation**	**Traininng/ Workshop/Event details**	**Date**	**Vanue**
1	Mr. W.M.A. Kumara	Senior Assistant Government Analyst	Research Manuscript: Identifying Gaps, Incorporating Feedback and finalizing the Manuscript and intergral Work place based research towards innovation	25.02.2025	Nilamedura, Narahenpita.
2	Mrs. S.L.R. Gunawardhana	Senior Assistant Government Analyst			
3	Mrs. M.A.J. Fernando	Senior Assistant Government Analyst			
4	Mrs. S.M.V.D. Mala	Senior Assistant Government Analyst			
5	Mrs. L.A.W.K.Dahanayaka	Senior Assistant Government Analyst			
6	Mrs. T.R.M.C. Dilhani Menike	Senior Assistant Government Analyst			
7	Mrs. M.E.J. Senevirathna	Senior Assistant Government Analyst			
8	Mrs. I.H. Kulathunga	Senior Assistant Government Analyst			

9	Mr. D.M.G.C. Bandara	Senior Assistant Government Analyst			
10	Mrs.E. Marasingha	Senior Assistant Government Analyst			
11	Mrs. A.S. Saputhanthri	Senior Assistant Government Analyst			
12	Mrs. T.H. Kurukulanatha	Senior Assistant Government Analyst			
13	Mr. W.P.A.R.D. Bandara	Senior Assistant Government Analyst			
14	Mrs. T.M.P.G.C.R. Senevirathna	Senior Assistant Government Analyst			
15	Mrs. S.Kulali	Senior Assistant Government Analyst			
16	Mrs.U.G.S.T. Gamage	Senior Assistant Government Analyst			
17	Mrs.L.R.T. Perera	Senior Assistant Government Analyst			
18	Mr. U.W.S. Premathilaka	Senior Assistant Government Analyst			
19	Mrs. R.A.B.S. Ranasinghe	Senior Assistant Government Analyst			
20	MS. D.R,I, Udeshini	Senior Assistant Government Analyst			
21	Mrs. K.D.W. Panchami	Senior Assistant Government Analyst			
22	Mrs. W.S.H.K. Jayawansha	Senior Assistant Government Analyst			
	Name of the Officer	**Designation**	**Traininng/ Workshop/Event details**	**Date**	**Vanue**
1	Mrs. P.G. De Siva	Assistant Government Analyst	GMCP Intergrated training Package to Ensure Legal Finish	26-30.05.2025/02-06.06.2025/09-13.06.2025/18-20.06.2025	Colombo
2	Mrs. K.M.D.S. Subaseela	Assistant Government Analyst			
	Name of the Officer	**Designation**	**Traininng/ Workshop/Event**	**Date**	**Vanue**

			details		
1	Mrs. M.A.J. Fernando	Senior Assistant Government Analyst	Regional Forensic Capacity Building for Synthetic Drug Detection & Analysis for South Asia	07-18.07.2025	Colombo
2	Mr. U.S. Prematthilaka	Senior Assistant Government Analyst			
3	Mrs. N.N. Bernard	Senior Assistant Government Analyst			
4	Ms. H.S.T. Kaushalya	Assistant Government Analyst			
	Name of the Officer	**Designation**	**Traininng/ Workshop/Event details**	**Date**	**Vanue**
1	Mr. W. A. R. Fernando	Deputy Government Analyst	A Regional Terrorism and Weapons of Mass Destruction (WMD) Workshop	15 - 19.09.2025	Colombo
	Name of the Officer	**Designation**	**Traininng/ Workshop/Event details**	**Date**	**Vanue**
1	කේ.ඒ.ඩී.සී. කොඩිතුවක්කු මිය	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක	Towards Public Sector Intergrity - Twodays Workshop for Internal Affairs Unit	29 -30 .12.2025	අරලිය ගහ මන්දිරය
2	කේ.ඒ.එස්.අයි. කේ. කළුආරච්චි මයා	සෑක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක			
3	ඩී.එම්.ජී.සී. බණ්ඩාර මයා	ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
	නම	**තනතුර**	**පාඨමාලාව**	**පුහුණු කාලය**	**පැවැත්වූ ස්ථානය**
1	කේ.කේ.ඩී. කරුණාරත්න මයා	රියැදුරු	රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල නැංවීම.	2025.11.20	CITRAC ආයතනය
2	එස්. ඒ. ගුණවර්ධන මයා	රියැදුරු			
	නම	**තනතුර**	**පාඨමාලාව**	**පුහුණු කාලය**	**පැවැත්වූ ස්ථානය**
1	ඩබ්.පී.අයි. උදයංගනී මිය	ප්‍රධාන ගණකාධිකාරී	රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	2025.10.04 දින සිට අවුරුද්දක කාලයකි	ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය
2	එම්.ඩී.එම්. කුමුදුනි	අධ්‍යක්ෂ (පරිපාලන)			

අංකය	නම	තනතුර	පාඨමාලාව	පාඨමාලාව පැවැත්වූ රට	පාඨමාලා කාලය
1	එල්.එස්. හතුරුසිංහ මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	Invitational Training on Toxicology Analysis for GAD staff	කොරියාව	2025.01.01 - 2025.01.22 (2024 දින ආරම්භ කර ඇත.)
2	සී. එන්. කුලසේකර මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
3	එම්.එම්. ඒ. කේ.කේ. පී. පෙරේරා මිය	නියෝජ්‍ය රස පරීක්ෂක	Invitation to visit New Zealand to Progress Laboratory Cooperation	New Zealand	2025.01.20 - 2025.01.24
4	ඩබ්. ජී.ඩී.එල්. ගුණතිලක මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	Multimedia Forensics	ඉන්දියාව	2025.08.04 - 2025.08.15
5	බී.එච්. මධුශිනී මෙය	සහකාර රස පරීක්ෂක	LC-MS-MS training	ඉන්දියාව	2025.08.06- 2025.08.09
6	එන්.එන්. බර්නාඩ් මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	Countering Illegal Drug Trafficking	ඉන්දියාව	2025.08.17 - 2025.08.31
7	එච්.එස්.ටී කෞශල්‍යා මෙය	සහකාර රස පරීක්ෂක	Training for Forensic Personnal Law Enforcement and custom Officer types Classification and Identification of Narcotic Drugs	ඉන්දියාව	2025.09.08 - 2025.0912
8	එච්.ටී.ටී. ප්‍රියදර්ශනී මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	Analytical Skill Development Course	ඉන්දියාව	2025.09.21- 2025.10.04
9	ඊ්.ජී.ආර්. තක්ශිලා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
10	අයි.එච්. කුලතුංග මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	Msc in Forensic Science	එක්සත් රාජධානිය	2025.09.20 - 2026.09.25
11	පී.එස්.කේ. රාජපක්ෂ මිය	ආණ්ඩුවේ රස පරීක්ෂක	Asia forensic Science Conference 2025	කොරියාව	2025.09.15 - 2025.09.19
12	ඩබ්.ඩී.වී. කරුණාරත්න	ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක			
13	කේ.කේ. අප්සරා මෙය	සැක කටයුතු ලේඛණ පිලිබඳ ආණ්ඩුවේ පරීක්ෂක			
14	කේ.ඒ.එස්.අයි.කේ. කළුආරච්චි මහතා	සැක කටයුතු ලේඛණ පිලිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක	FIELDS Regional Engagement Symposium	තායිලන්තය	2025.12.02 - 2025.12.04

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාල අවශ්‍යතාවය	අනුකූලතා තත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
1	නියමිත දිනයට මූල්‍ය ප්‍රකාශන/ගිණුම් ඉදිරිපත් කර තිබුණේ?			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	ඔව්		
1.2	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	ඔව්		
1.3	වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නැත		
1.6	වෙනත් - පොදු තැන්පත් ගිණුම	ඔව්		
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම			
2.1	2018.11.21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය	ඔව්		
2.2	පුද්ගල පඩි නඩි ලේඛනය/පුද්ගල පඩි නඩි කාඩ්පත්	ඔව්		
2.3	විගණන විමසුම් ලේඛනය	ඔව්		
2.4	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය	ඔව්		
2.5	සිගාස් පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කර මාසික ගිණුම් සාරාංශ පිලියෙල කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන්නේද?	ඔව්		
2.6	ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය	ඔව්		
2.7	බඩු ලේඛන පොත	ඔව්		
2.8	තොග පොත	ඔව්		
2.9	හානි පිළිබඳ ලේඛනය	ඔව්		
2.10	බැරකම් ලේඛනය	ඔව්		
2.11	චෙක්පත් උප පත්‍රිකා ලේඛනය	ඔව්		
3	මූල්‍ය බලතල පැවරීම			
3.1	මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදුකර තිබේද?	ඔව්		
3.2	මූල්‍ය බලතල පැවරීම ආයතනය තුළ සන්නිවේදනය කර තිබේද?	ඔව්		
3.3	එම මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා තිබුණේද?	ඔව්		
3.4	2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන් විසින් පහත සඳහන් පාලන ක්‍රම අනුගමනය කර තිබේද?	ඔව්		
4	වාර්ෂික සැලසුම් පිලියෙළ කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙළ කර තිබුණේද?	ඔව්		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිලියෙළ කර තිබුණේද?	ඔව්		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබේද?	ඔව්		
4.4	ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර තිබේද?	ඔව්		
4.5	වර්ෂය ආරම්භයේදී එක් එක් මාසයට අදාළව අවශ්‍ය වන මුදල් අවශ්‍යතාවය ඇතුළත් මුදල් ප්‍රවාහය සැලසුම් කර එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළේද?	ඔව්		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියළුම විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළදී පිළිතුරු ඉදිරිපත් කර තිබේද?/විගණන විමසුම් නොතිබුණේද?	ඔව්		
6	අභ්‍යන්තර විගණනය			

6.1	සියළුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළතදී පිළිතුරු ඉදිරිපත් කර තිබුණේද? අභ්‍යන්තර විගණන විමසුම් නොතිබුණේද?	ඔව්		
6.2	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	ඔව්		
6.3	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	ඔව්		
6.4	මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කරන ලද්දේද?	අදාල නැත		
7	විගණන හා කළමනාකරණ කමිටුව			
7.1	විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට 04ක් හෝ පවත්වා තිබුණේද? සහභාගී වී තිබුණේද?	අමාත්‍යාංශයේ පැවැති රැස්වීම් 04ක් සඳහා සම්බන්ධ වී ඇත.		
8	වත්කම් කළමනාකරණය			
8.1	2017.07.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාල වෙත ඉදිරිපත් කරන ලද්දේද?	ඔව්		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත් කර ඒ බව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට දන්වා යවන ලද්දේද?	ඔව්		
8.3	2016.03.31 දිනැති අංක 05/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළේද?	ඔව්		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාල වකවානු තුළ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුවී නොතිබුණේද?	ඔව්		
8.5	මු.රෙ 772 අනුව අබලි ද්‍රව්‍ය අපහරණය කර තිබේද?	ඔව්		
9	වාහන පාලනය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද?	ඔව්		
9.2	වාහනයක් ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කරනු ලබන්නේද? එවැනි වාහන නොතිබුණේද?	ඔව්		
9.3	සෑම වාහනයක් සඳහාම වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර තිබේද?	ඔව්		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබේද? එසේ අනතුරු සිදුවී නොතිබුණේද?	ඔව්		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර තිබේද?	ඔව්		
9.6	ලීසිං වාරික ගෙවා අවසන් වාහන වල පරම අයිතිය පවරාගෙන තිබුණේද?	ඔව්		
10	බැංකු ගිණුම් ප්‍රකාශය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා සූදානම් කර තිබුණේද?	ඔව්		
10.2	සමාලෝචන වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට පැවත එමින් තිබුණු අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කළේද? එවැනි ගිණුම්	ඔව්		

	නොතිබුණේද?			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබුණු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව කටයුතු කර එම ශේෂ මාසයක් ඇතුලත නිරවුල් කර තිබුණේද?/එවැනි ගැලපුම් නොතිබුණේද?	ඔව්		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	වැය විෂයකට හෝ ව්‍යාපෘතියකට හෝ වැඩසටහනකට හෝ ශීර්ෂයකට සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කර තිබුණේද?	ඔව්		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණේද? එවැනි බැරකම් වලට එළඹ නොතිබුණේද?	ඔව්		
12	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම			
12.1	අදාළ අත්තිකාරම් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණේද? /පාර්ලිමේන්තුව විසින් අත්තිකාරම් කාර්යයක් පවරා තිබුණේද?	ඔව්		
12.2	හිඟහිටි ණය ශේෂ වල කාල විශ්ලේෂණයක් පිළියෙළ කර තිබුණේද? එවැනි ශේෂ නොතිබුණේද?	ඔව්		
12.3	වර්ෂ 1කට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබුණේද? එවැනි හිඟහිටි ශේෂ නොතිබුණේද?	නැත	• රු.18,754/- ක ණය ශේෂය නඩු තීන්දුවෙන් පසුව නිරවුල් කරනු ඇත. • රු. 2,800/- ක ණය ශේෂයන් සඳහා ගෙවීම් කරන ලෙස අදාල නිලධාරීන්ට දන්වා ඇත. • වැඩ තහනමට ලක් වූ නිලධාරියකුගේ 148,800.00ක ණය ශේෂයක් ඇත.	
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබුණේද? එවැනි තැන්පතු නොතිබුණේද?	ඔව්		
13.2	පොදු තැන්පත් ලේඛනය නඩත්තු කරමින් පවතීද?	ඔව්		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළේද?	ඔව්		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කළේද? එසේ අග්‍රිම නිකුත් නොකළේද?	ඔව්		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබුණේද?	ඔව්		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා අනාවරණය වූ වෙනස්කම් මාසිකව සසඳා තිබුණේද?	ඔව්		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ විධිවිධාන වලට අනුකූලව රැස්කළ ආදායම් ආපසු ගෙවා තිබුණේද?/ එසේ ආදායම් ආපසු ගෙවා නොතිබුණේද?	ඔව්		
15.2	රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැරකර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැරකර හෝ තිබුණේද? එවැනි ආදායම් නොතිබුණේද?	ඔව්		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේද?	ඔව්		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය අනුයුක්ත කර/බඳවා ගෙන තිබේද?	නැත		
16.2	කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත ලිඛිත කාර්යය පැවරුම් කර තිබේද?	ඔව්		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරණ කළමනාකරණ සේවා චක්‍ර			

	ලේඛය ප්‍රකාරව ආයතනයේ නිළධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යෑම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මිය යාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්යය මණ්ඩලය වෙනස් වීම් අනුව යාවත්කාලීන කරන ලද කාර්යය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණේද?	ඔව්		
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැනගැනීමේ පනත පනත ප්‍රකාරව මහජනයා වෙත අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු ලබාදීම සඳහා වගකිව යුතු නිලධාරියෙක් පත්කර තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?	ඔව්		
17.2	මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීම, ලේඛන ගත කිරීමට ඒම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය දැක්වෙන ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?	ඔව්		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන ඡේද වලට අනුකූලව අර්ධ වාර් ෂිකව හා වාර් ෂිකව වාර්තා ඉදිරිපත් කර තිබේද?	ඔව්		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	2018.01.24 දිනැති අංක 05/2018 (1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙන් හඳුන්වා දී ඇති පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව අමාත්‍යාංශ/දෙපාර්තමේන්ත්ව විසින් පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය පිලියෙල කර ඒය ක්‍රියාත්මක කර තිබේද?	ඔව්		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිලියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගයීම සඳහා අමාත්‍යාංශය/දෙපාර් තමේන්තුව විසින් ඒ් සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද?	ඔව්		
19	මානව සම්පත් සැලැස්ම පිලියෙල කිරීම			
19.1	2018.01.24 දිනැති අංක 02/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර තිබේද?	ඔව්	-	
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ සහතික කර තිබේද?	ඔව්		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කර ගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර් ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබේද?	නැත	කාර්ය සාධන ගිවිසුම සකස් කරමින් පවතී.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කරන ලද්දේද?	ඔව්		
20	විගණන ඡේද			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත්කළ විගණන ඡේද වලින් පෙන්වා දී තිබුණු අඩුපාඩු නිවැරදි කර තිබුණේද? ඒවැනි විගණන ඡේද නොතිබුණේද?	ඔව්		